# කාර්යසාධන වාර්තාව - 2018

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

# පටුන


**1.0 දෙපාර්තමේන්තු පැතිකඩ**

1.1 හැඳින්වීම
1.2 දැක්ම
1.3 මෙහෙවර
1.4 කාර්යයන්
1.5 සංවිධාන සටහන

**2.0 රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් 2018**

2.1 සමාලෝචනය
2.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග
2.3 රාජ්‍ය ආදායමෙහි ප්‍රවණතා
2.3.1 රාජ්‍ය ආදායම
2.3.2 බදු ආදායම
2.3.3 බදු නොවන ආදායම

**3.0 රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා අභියෝග 2018**

3.1 රජයේ මූල්‍ය ක්‍රමෝපායන්
3.2 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝග

**4.0 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ අදාළ වාර්තා ප්‍රකාශයට පත් කිරීම**

4.1 වාර්ෂික වාර්තාව - 2017
4.2 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2018
4.3 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2019
4.4 කාර්යසාධන වාර්තාව - 2017
4.5 තොරතුරු දැනගැනීමේ පනතට අදාළ වාර්තා

**5.0 ආයතන හා ගිණුම් අංශයේ කාර්යසාධන**

5.1 කාර්යාල සේවක සංඛ්‍යාව
5.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම
5.3 මූල්‍ය පරිපාලනය

**වගු අන්තර්ගතය**


2.1.1 රාජ්‍ය ආදායමේ සාරාංශය
2.2.1 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග - 2018
2.3.1.1 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම - 2018
2.3.1.2 රාජ්‍ය ආදායම
2.3.1.3 රජයේ බදු ආදායම - ප්‍රභවයන් අනුව
2.3.2.1 ආදායම් බදු කාර්යසාධනය
2.3.2.2 එකතු කළ අගය මත බදු ආදායම
2.3.2.3 මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ සුරාබදු/නිෂ්පාදන බදු ආදායම
2.3.2.4 මෝටර් රථ වාහන ආනයන
2.3.2.5 විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත
2.3.2.6 පළාත් සභා වෙත පවරනු ලැබූ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම - 2018
2.3.2.7 ජාත්‍යන්තර වෙළඳ කටයුතු මඟින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාරය 2016 - 2018
2.3.3.1 බදු නොවන ආදායම
4.5.1 2018 තොරතුරු දැනගැනීමේ පනතට අදාළ ඉල්ලීම් සාරාංශය
5.1.1 සේවක සංඛ්‍යා විස්තර 2018 (2018.12.31 දිනට)
5.2.1 දේශීය පුහුණු - 2018
5.2.2 විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ -2018
5.3.1.1 අයවැය ප්‍රතිපාදන සහ උපයෝජනය
5.3.2.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 2018


**රූප සටහන් අන්තර්ගතය**


2.1.1 රාජ්‍ය ආදායම 2011-2018
2.3.1.1 බදු සහ බදු නොවන ආදායම 2011 - 2018
2.3.2.1 සෘජු බදු 2011 - 2018
2.3.2.2 ආදායම් බදු කාර්යසාධනය
2.3.2.3 වක්‍ර බදු 2011 -2018
2.3.2.4 දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම
2.3.2.5 මත්පැන් නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම
2.3.2.6 ආනයන සහ අපනයන බදු
2.3.3.1 බදු නොවන ආදායම

## 1.0 දෙපාර්තමේන්තු පැතිකඩ

### 1.1 හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වනුයේ අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ, වෙනත් ආයතන සහ පුද්ගලික අංශයේ ආයතන සමග මනා සහසම්බන්ධයකින් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ වෙනත් මූල්‍ය විශ්ලේෂණය හා දේශීය, විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදුකිරීම සඳහා පහසුකම් සැපයීම ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

තවද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ ක්‍රියාත්මක කළ යුතු අවශ්‍යතාවයන් වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව, අයවැය, ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, වසර අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සහ පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ද දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වේ.

### 1.2 දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම

### 1.3 මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියාරාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

### 1.4 කාර්යයන්

පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම;

බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සකස් කිරීම (තීරුබදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර);

ආදායම් රැස් කරන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත් ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය ;

- රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට අනුව නීතිමය සංශෝධන කිරීමට අදාළ කටයුතු හැසිර වීම
- රාජ්‍ය මූල්‍ය හා සාර්ව ආර්ථික කරුණු වලට අදාළ සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම

සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.

## 2.0 රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් - 2018

### 2.1 සමාලෝචනය

"දැක්ම 2025"ට සමගාමීව ආදායම් එක්රැස් කිරීම වැඩි දියුණු කිරීම පමණක් නොව, 2018 වසරේදී කාර්යක්ෂමව වියදම් කිරීම වැඩි දියුණු කිරීම ද රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ දී අවධානයට යොමු විය. ඒ අනුව, 2017 වසරේ සමාන කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී රු. බිලියන 1839ක් වූ රාජ්‍ය ආදායම 2018 ජනවාරි - දෙසැම්බර් කාලපරිච්ඡේදය තුළ රු.බිලියන 1932 දක්වා සියයට 4.8කින් වර්ධනය වී ඇත. මුළු රාජ්‍ය ආදායම සියයට 2.5කින් රු. බිලියන 1712ක් දක්වා වර්ධනය වූ අතර බදු නොවන ආදායම සියයට 28.6කින් රු. බිලියන 208ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2017 වසරේ රු. බිලියන 8ක් වූ ප්‍රදානයන් 2018 වසරේදී රු. බිලියන 12.3 දක්වා සියයට 53.1කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

රඳවා ගැනීමේ බදු ආදායමේ බදු අඩු වීමක් සිදු වුවත්, 2018 අප්‍රේල් 01 දින සිට නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලනය හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ශක්තිමත් කිරීම සහ බදු පදනම පුළුල් කිරීම හා බදු ප්‍රතිශතයන් ඉහළ නැංවීම හේතුවෙන් ආදායම් බදු රු. බිලියන 310.5ක් දක්වා සියයට 13.1කින් ඉහළ ගොස් ඇත.

දේශීය කටයුතු පුළුල් කිරීම සහ ගල් අඟුරු, කිරිපිටි, සිමෙන්ති සහ ලිහිසි තෙල් ආනයනය ඉහළ යාම හේතුවෙන් එකතු කළ අගය මත බදු (VAT) ආදායම 2018 වර්ෂයේ දී සියයට 4.0කින්, රු. බිලියන 461.7ක් දක්වා වර්ධනය වී ඇතත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ලබා දුන් බදු සහන 2018 වර්ෂයේ එකතු කළ අගය මත බදු ඉලක්කගත ආදායම සපුරා ගැනීමට බාධාවක් විය.

මෝටර් රථ, මත්පැන්, සිගරට් සහ දුම්කොළ මත වන නිෂ්පාදන බදු ආදායම ඉහළ යාම නිසා නිෂ්පාදන බදු ආදායම සියයට 3.1කින් රු. බිලියන 484.3 දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත් ඛනිජ තෙල් නිෂ්පාදන ආශ්‍රිත නිෂ්පාදන බදු සියයට 10.4කින් පහත වැටී ඇත.

යන්ත්‍රෝපකරණ සඳහා වරාය හා ගුවන් තොටුපළ බදු සඳහා සම්මත බදු අනුපාතය වන සියයට 7.5 සිට සියයට 2.5 සහනදායී අනුපාතය ලබා දීම හමුවේ වුව ද අන්තර් භාණ්ඩ සහ පොහොර ආනයන ඉහළ යාමත් ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව විනිමය අනුපාතය අවප්‍රමාණය වීමත් නිසා වරාය හා ගුවන් තොටුපළ බදු ආදායම රු.බිලියන 114 දක්වා සියයට 11.3කින් ඉහළ ගොස් ඇත.

ඉදිකිරීම් සේවා සඳහා බදු නිදහස් කිරීම් හමුවේ වුවත් නේවාසික මහල් නිවාස අලෙවිය, දේශීය සංචාරක නියෝජිත සේවා මඟින් ලද විදේශ විනිමය ලැබීම හේතුවෙන් ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ආදායම රු. බිලියන 71.4ක් දක්වා වර්ධනය වී ඇත.

අන්තර්ජාල මත වන විදුලි සංදේශ බද්ද ඉවත් කිරීම සහ ඇමතුම් කාලසීමාව පහත වැටීම හේතුවෙන් විදුලි සංදේශ බද්ද සියයට 15.2කින්, රු. බිලියන 28.3 දක්වා පහත වැටී ඇත. එසේම හඳුනාගත් භාණ්ඩ 253කින් සෙස් බද්ද ඉවත් කිරීම හේතුවෙන් සෙස් ආදායම ද සියයට 10.4කින් පහත වැටී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභාංශ පැවරීම් සහ රජයේ නිලධාරීන්ගේ සමාජ ආරක්ෂණ දායක වීම් ඉහළ යාම බදු නොවන ආදායම ද සියයට 28.7කින් රු. බිලියන 207.6 දක්වා ඉහළ යාමට මූලිකව බලපා ඇත.

මේ අතර 2018 වර්ෂයේ රාජ්‍ය ණය ආපසු ගෙවීම් රු. බිලියන 309ක්, පොලී ගෙවීම් රු. බිලියන 852ක් හා රාජ්‍ය සේවකයින්ගේ වැටුප් රු. බිලියන 628 දක්වා ඉහළට යාම සමස්ත රාජ්‍ය වියදම් සහ ශුද්ධ ණය 4.6 ප්‍රතිශතයකින් රු. බිලියන 2,692 දක්වා ඉහළ යාමට බලපා ඇත. පුනරාවර්තන වියදම් සියයට 8.4කින් රු. බිලියන 2090ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එම කාලපරිච්ඡේදය තුළ ප්‍රාග්ධන වියදම් සුළු වශයෙන් අඩු වී ඇත. 2017 වර්ෂයේ සමාන කාලසීමාව තුළ වාර්තා වූ රු. බිලියන 733ට සාපේක්ෂව 2018 වර්ෂයේ එම කාලය තුළ අයවැය හිඟය රු. බිලියන 760ක් විය. 2017 වර්ෂයේ රු. බිලියන 382ක් වූ ශුද්ධ විදේශ මූල්‍යනය 2018 වර්ෂයේදී රු. බිලියන 444ක් වූ අතර ශුද්ධ දේශීය මූල්‍යනය 2017 වසරේ රු. බිලියන 352ට සාපේක්ෂව 2018 වසරේදී රු. බිලියන 316ක් විය.

**2.1.1** වගුව | රාජ්‍ය ආදායමේ සාරාංශය

රු.මිලි.

| අයිතමය | 2014 | 2015 | 2016 | 2017 | 2018 (තාවකාලික) |
|---|---|---|---|---|---|
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **1,204,621** | **1,460,892** | **1,693,557** | **1,839,562** | **1,932,243** |
| **මුළු ආදායම** | **1,195,206** | **1,454,878** | **1,686,061** | **1,831,531** | **1,919,949** |
| බදු ආදායම | 1,050,362 | 1,355,779 | 1,463,689 | 1,670,178 | 1,712,318 |
| ආදායම් බදු | 198,115 | 262,583 | 258,857 | 274,562 | 310,449 |
| භාණ්ඩ හා සේවා මත බදු | 615,832 | 803,798 | 841,967 | 1,025,799 | 106,1752 |
| විදේශ වෙළෙඳාම මත බදු | 236,415 | 289,398 | 362,865 | 369,817 | 340,117 |
| බදු නොවන ආදායම් | 144,844 | 99,099 | 222,372 | 161,353 | 207,631 |
| **ප්‍රදාන** | **9,415** | **6,014** | **7,496** | **8,031** | **12,294** |
| | | | ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස | | |
| **ආදායම සහ ප්‍රදාන** | **11.6** | **13.3** | **14.2** | **13.8** | **13.5** |
| **මුළු ආදායම** | **11.5** | **13.3** | **14.2** | **13.8** | **13.4** |
| බදු ආදායම | 10.1 | 12.4 | 12.3 | 12.6 | 11.9 |
| බදු නොවන ආදායම | 1.4 | 0.9 | 1.9 | 1.2 | 1.4 |
| **ප්‍රදාන** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රූප සටහන 2.1 .1 | රාජ්‍ය ආදායම 2011 - 2018



## 2.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

2018 වර්ෂය තුළ දී, රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාව පිළිබඳ රජයේ මධ්‍යකාලීන ප්‍රතිපත්ති සමඟ අනුගත වෙමින් රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති කිහිපයක් අනුගමනය කරන ලදී. ඒ අතර බදු සංශෝධනය, බදු නිදහස් කිරීම් හා සහන යථාර්ථකරණය, බදු පදනම පුළුල් කිරීම සහ විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වැනි බදු එකතු කිරීමේ ආයතන ශක්තිමත් කිරීම මීට අයත් වේ.

බදු සංශෝධනය යටතේ, එන්ජින් ධාරිතාවය 1000ට වඩා අඩු මෝටර් රථ වාහන සහ 72mm සහ 84mm වූ සිගරට් සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු 2018 අගෝස්තු මාසයේ දී ඉහළ දමන ලදී. ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායන් විසින් පානීය නොවන ස්ප්‍රීතු ආනයනයේ දී සුරාබදු ආඥාපනතේ 52 වැනි වගන්තිය යටතේ ගෙවිය යුතු නිෂ්පාදන බද්ද 2018 ඔක්තෝබර් මාසයේ සිට නිදහස් කර ඇත. එකතු කළ අගය මත බදු (VAT) සංශෝධන යටතේ, සීනි ආනයනය සහ සැපයුම මත බද්ද සියයට 15 සිට සියයට 0 දක්වා අඩු කරන ලද අතර ඉරු දැව ආනයනය සඳහා සියයට 15 සිට සියයට 5 දක්වා අඩු විය.

1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු පනත යටතේ සහනදායී වාහන ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය වඩාත් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු පනත සංශෝධනය කර ඇත. මීට අමතරව, අධි තාක්ෂණික යන්ත්‍ර සහ උපකරණ සඳහා සියයට 2.5ක සහනදායී වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන (PAL) බදු අනුපාතයක් ලබා දෙන ලදී. තේ තොග අපනයනය සඳහා කිලෝග්‍රෑමයට රු. 10ක සෙස් බදු අනුපාතයක් සහ රෙදි බෑග් සහ එම අමුද්‍රව්‍ය මත කිලෝග්‍රෑමයට රු. 25ක් හෝ සියයට 25ක් ලෙස නව සෙස් බදු අනුපාතයක් හඳුන්වා දෙන ලදී. සනීපාරක්ෂක තුවා සඳහා කිලෝග්‍රෑමයට රු. 300ක් හෝ සියයට 30ක් ලෙස පැවති සෙස් බදු ඉවත් කරන ලදී. 2018 අංක 25 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත යටතේ, කාමර ගාස්තු හැර පෞද්ගලික වෛද්‍ය සේවා සැපයීම මත එකතු කළ අගය මත බදු අය කිරීමෙන් නිදහස් කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ මූල්‍ය සේවා සැපයීම සහ ළදරු කිරිපිටි, පොත්, සඟරා සහ වාර සඟරා වැනි සැපයුම් සඳහා බදු සහන ලබා දෙන ලදී. මල් හා පැළ, රෙදි, දැව සහ දැව භාණ්ඩ, පැළැටි සහ යන්ත්‍ර සූත්‍ර/කාර්මික රාක්ක ආදිය ආනයනය හෝ ආනයනික සැපයුම මත වූ එකතු කළ අගය මත බදු සහනය ඉවත් කරන ලදී. මත්පැන් වලට අදාළ ජාතිය ගොඩනැඟීමේ බදු සහන ඉවත් කිරීම හා මෝටර් සවි නොකළ උපකරණ හා ජල ක්‍රීඩා උපකරණ ගෙවීම් මත ජාතිය ගොඩනැගීමේ බදු සහන දීම සඳහා 2009 අංක 09 දරන ජාතිය ගොඩගැනීමේ පනත සංශෝධනය කරන ලදී. එමෙන්ම ඉහත සංශෝධනය මඟින් කපා නැවත අපනයන කිරීමේ අරමුණින් මැණික් ගල් ආනයනය හා 2017 අගෝස්තු 01 දිනට පෙර සිදු කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ක්‍රියාත්මක ඉදිකිරීම් සේවා සඳහා ජාතිය ගොඩනැඟීමේ බදු සහන ලබා දෙන ලදී.

බදු පදනම පුළුල් කිරීම යටතේ සීනි අඩංගු වූ පළතුරු ආශ්‍රිත පාන වර්ග, කාර්මික මේද අම්ල සහ සීනි සඳහා නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු හඳුන්වා දෙන ලදී. AFL 1,AFL 2, AFL 3 සහ AFL 4 මත්පැන් බලපත්‍ර ද ඇතුළු ව බෝතල් කළ රා විකිණීම සඳහා මුද්දර ගාස්තු හඳුන්වා දෙන ලදී. 2018 අංක 35 දරන මුදල් පනත යටතේ මෝටර් රථ වල එන්ජින් ධාරිතාව, ඉන්ධන වර්ගය හා වාහනයේ වයස අනුව මෝටර් රථ සඳහා කාබන් බද්ද හඳුන්වා දෙන ලදී. එම පනත යටතේම, මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත සියයට 7ක ණය ආපසු ගෙවීමේ බද්දක් හඳුන්වා දෙන ලද අතර ජංගම දුරකථන කුලුනු සඳහා බද්ද වසරකට රු. 200,000 ක් සහ ජංගම දුරකථන ක්‍රියාකරුවන් සඳහා ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා බද්දක් ක්‍රියාත්මක කරන ලදී. එසේම සංචාරක ක්ෂේත්‍රයට සහ ඔවුන්ගේ වර්ගීකරණයට අනුව සමාගම් සඳහා සංචාරක සංවර්ධන බද්දක් සහ වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ බද්දක් හඳුන්වා දෙන ලදී.

2018 අප්‍රේල් 01 වන දින ක්‍රියාත්මක 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය ශක්තිමත් කර ඇත. ඉහත පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු ව්‍යුහය ස්තර තුනක් (සියයට 14, සියයට 28, සහ සියයට 40) යටතේ හඳුන්වා දෙන ලද අතර පෞද්ගලික ආදායම් බදු සීමාව රු. 500,000 සිට රු. 600,000 දක්වා පුළුල් කොට ඉහළම ආන්තික බදු සියයට 16.0 සිට සියයට 24.0 දක්වා ඉහළ නංවනු ලැබීය. තව ද නව පනත යටතේ ප්‍රාග්ධන දීමනා ව්‍යුහය සහ රඳවා ගැනීමේ බදු අනුපාතය සංශෝධනය කරන ලදී. අදාළ ප්‍රධාන මූල්‍ය කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වගු ගත කෙරේ.

වගුව 2.2.1 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2018

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** | |
| 2018.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/33 දරන ගැසට් නිවේදනය).<br>- අංක 22/99 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ කාණ්ඩ I, II සහ III ලෙස වර්ග කරන ලද හිමිකම් ලබන්නන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු. මිලියන 22, රු. මිලියන 16 සහ රු. මිලියන 12 වශයෙන් ඉහළ නැංවීමට. |
| 2018.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/34 දරන ගැසට් නිවේදනය).<br>- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය කිරීමට හිමිකම් ලබන්නන් සඳහා වූ උපරිම නිෂ්පාදන බදු නිදහස් සීමාව රු. මිලියන 5 දක්වා ඉහළ දැමීමට. |
| 2018.04.12 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.04.12 දිනැති අංක 2066/40 දරන ගැසට් නිවේදනය).<br>- පළාත් පාලන සහ පළාත් සභා චක්‍රලේඛ අංක 01/2017 යටතේ වාහන ආනයනය සඳහා සුදුසුකම් ලබන 2017.11.09 දිනට පෙර ණයවර ලිපි විවෘත කරන ලද හිමිකම් ලබන්නන් සඳහා බදු සහන ලබා දීමට. |
| 2018.04.24 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.04.24 දිනැති අංක 2068/9 දරන ගැසට් නිවේදනය).<br>- විශ්‍රාමික ජෙනරාල් හැමිල්ටන් වනසිංහ මහතාට වාහන ආනයනය සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීමට. |
| 2018.05.15 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.05.15 දිනැති අංක 2071/16 දරන ගැසට් නිවේදනය).<br>- රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ රාජ්‍ය තාන්ත්‍රික සංවිධාන විසින් 100% ක බදු නිදහසක් යටතේ ආනයනය සහ ලියාපදිංචි කර ඇති වාහන විකිණීම සහ ක්ෂය කිරීම සඳහා වාර්ෂික පදනමින් නිෂ්පාදන බදු අඩු කිරීම් ප්‍රතිශත හඳුන්වා දීමට. |
| 2018.05.31 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.05.31 දිනැති අංක 2073/41 දරන ගැසට් නිවේදනය).<br>- භූමිතෙල් මත ලීටරයකට රු. 7.00ක නිෂ්පාදන බද්දක් හඳුන්වා දීමට. |
| 2018.06.09 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.06.08 දිනැති අංක 2074/39 දරන ගැසට් නිවේදනය).<br>- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍ර ලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය සඳහා හිමිකම් ලබන්නන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු. මිලියන 5 සිට රු. මිලියන 3.6 දක්වා සංශෝධනය කිරීමට. |
| 2018.06.14 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.06.14 දිනැති අංක 2075/51 දරන ගැසට් නිවේදනය).<br>- භූමිතෙල් මත පනවන ලද නිෂ්පාදන බදු ඉවත් කිරීමට. |
| 2018.07.25 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.12 දිනැති අංක 2079/58 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පානයන් හි එම සීනි ප්‍රමාණය පදනම් ව නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| 2018.07.17 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.17 දිනැති අංක 2080/31 දරන ගැසට් නිවේදනය).<br>- අදාල ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් නීති හා කොන්දේසි වෙනස් නොකරමින් වාහන ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචි කිරීමට ලබා දී තිබූ සහන කාලයට අදාළ කොන්දේසිය ඉවත් කිරීමට. |
| 2018.08.01 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.31 දිනැති අංක 2082/10 දරන ගැසට් නිවේදනය).<br>- එන්ජින් ධාරිතාවය 1,000 ට අඩු මෝටර් රථ මත නිෂ්පාදන බදු ඉහළ දැමීමට. |
| 2018.08.01 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.07.31 දිනැති අංක 2082/11 දරන ගැසට් නිවේදනය).<br>- මි.මී. 72ට වඩා දිගින් යුක්ත දුම්වැටි මත නිෂ්පාදන බදු ප්‍රමාණය ඉහළ දැමීමට. |
| 2018.08.06 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.08.06 දිනැති අංක 2083/02 දරන ගැසට් නිවේදනය).<br>- 2018 වසරේ අගෝස්තු මස 01 වන දිනට හෝ ඊට පෙර ණයවර ලිපි විවෘත කර තිබීම |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | පදනම්ව මෝටර් රථ ආනයනය සඳහා බදු සහන ලබා දීම විධිමත් කිරීමට. |
| 2018.09.18 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.09.17 දිනැති අංක 2089/18 දරන ගැසට් නිවේදනය).<br>- සීනි මත නිෂ්පාදන බදු පැනවීමට. |
| 2018.10.09 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.10.08 දිනැති අංක 2092/5 දරන ගැසට් නිවේදනය).<br>- මේද අම්ල මත නිෂ්පාදන බදු පැනවීමට. |
| 2018.11.02 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.11.01 දිනැති අංක 2095/18 දරන ගැසට් නිවේදනය).<br>- ඩීසල් මත නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| 2018.11.12 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.11.12 දිනැති අංක 2097/3 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පාන වර්ග මත නිෂ්පාදන බදු පැනවීම නැවත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට. |
| 2018.12.04 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.12.03 දිනැති අංක 2100/3 දරන ගැසට් නිවේදනය).<br>- සීනි අඩංගු පානයන් හි එම සීනි ප්‍රමාණය පදනම්ව නිෂ්පාදන බදු සංශෝධනය කිරීමට. |
| **සුරා බද්ද** | |
| 2018.01.11 | අංක 01/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.10 දිනැති අංක 2053/21 දරන ගැසට් නිවේදනය).<br>- මත්පැන් බලපත්‍ර ලාභී ආයතන ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කර තබනු ලබන වේලාව හා වසා තබන වේලාව සංශෝධනය කිරීමට. |
| 2018.01.10 | අංක 02/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.10 දිනැති අංක 2053/26 දරන ගැසට් නිවේදනය).<br>- සුරා බදු නිවේදන අංක 666 කින් සඳහන් නියමයන් සංශෝධනය කිරීමට. |
| 2018.01.18 | අංක 03/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.18 දිනැති අංක 2054/41 දරන ගැසට් නිවේදන).<br>- 2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරා බදු නිවේදන අංක 01/2018 හි සඳහන් "මත්පැන් බලපත්‍ර ලාභී ආයතන වල ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව තබන වේලාවන් හා වසා තබනු ලබන වේලාවන්" සංශෝධනය කිරීමට. |
| 2018.01.18 | අංක 04/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.18 දිනැති අංක 2054/42 දරන ගැසට් නිවේදනය).<br>- 2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරා බදු නිවේදන අංක 666 සඳහන් නියමයන් සංශෝධනය කරමින් නිකුත් කළ 02/2018 දරන සුරා බදු නිවේදනය සංශෝධනය කිරීමට. |
| 2018.01.22 | අංක 05/2018 හා අංක 06/2018 දරන සුරා බදු නිවේදනය, (2018.01.23 දිනැති අංක 2055/09 දරන ගැසට් නිවේදනය).<br>- ගැසට් නිවේදන අංක 1001 සහ 1002 සඳහන් "පල්පය" යන වචනය ඉවත් කිරීමට. |
| 2018.02.21 | අංක 07/2018 දරන සුරාබදු නිවේදනය, (2018.02.21 දිනැති අංක 2059/32 දරන ගැසට් නිවේදනය).<br>- පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කිරීමේ දී තොග කිලෝ ග්‍රෑමයක් සඳහා අයකරන ලද සුරා බද්ද රු. 9.00 කින් අඩු කිරීමට. |
| 2018.04.01 | අංක 08/2018 දරන සුරා බදු නිවේදනය, (2018.04.09 දිනැති අංක 2066/2 දරන ගැසට් නිවේදනය).<br>- සුරා බදු ආඥා පනතේ සිදු කරන ලද සංශෝධනයට අනුව රා මැදීම හා බෑම සඳහා බලපත්‍ර ගාස්තුව සංශෝධනය කිරීමට. |
| 2018.04.16 | අංක 09/2018 දරන සුරා බදු නිවේදනය, (2018.04.06 දිනැති අංක 2065/57 දරන ගැසට් නිවේදනය).<br>- රා බෝතල් කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 500,000 කින් අඩු කිරීමට. |
| 2018.06.13 | අංක 10 /2018 දරන සුරා බදු නිවේදනය, (2018.06.13 දිනැති අංක 2075/23 දරන ගැසට් නිවේදනය).<br>- අංක 07/2018 දරන සුරා බදු නිවේදනය සංශෝධනය කිරීමට. |
| 2018.06.13 | අංක 11/2018 දරන සුරා බදු නිවේදනය, (2018.06.13 දිනැති අංක 2075/24 දරන ගැසට් නිවේදනය).<br>- රා තැබෑරුම් විවෘතව තබන වේලාවන් හා වසා තබනු ලබන වේලාවන් සංශෝධනය කිරීමට. |
| 2018.10.04 | අංක 12/2018 දරන සුරා බදු නිවේදනය, (2018.10.03 දිනැති අංක 2091/50 දරන ගැසට් නිවේදනය). |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | - පානීය නොවන ස්ප්‍රීතු ආනයනයේ දී සුරා බදු පැනවීමෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුමත සමාගම් නිදහස් කිරීමට. |
| **වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද** | |
| 2018.04.05 | 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත, (2018.04.06 දිනැති අංක 2065/42 දරන ගැසට් නිවේදනය).<br>- අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මත සියයට 2.5ක අනුග්‍රාහක වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් ප්‍රදානය කිරීමට. |
| 2018.07.11 | 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත, (2018.11.07 දිනැති අංක 2079/34 දරන ගැසට් නිවේදනය).<br>- අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මත සියයට 2.5ක අනුග්‍රාහක වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දක් ප්‍රදානය කිරීමට. |
| **මුද්දර බද්ද** | |
| 2018.10.01 | 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.10.01 දිනැති අංක 2091/3 දරන ගැසට් නිවේදනය).<br>- AFL 1, AFL 2, AFL 3 සහ AFL 4 යටතේ වන මත් පැන් බලපත්‍ර සහ බෝතල් කළ රා අලෙවිය මත මුද්දර බදු පැනවීමට. |
| **සෙස් බද්ද** | |
| 2018.07.25 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.07.24 දිනැති අංක 2081/10 දරන ගැසට් නිවේදනය).<br>තේ තොග අපනයන සම්බන්ධව කිලෝ ග්‍රෑමයට රු. 10.00 සෙස් බද්දක් හඳුන්වා දීමට. |
| 2018.09.26 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.09.25 දිනැති අංක 2090/05 දරන ගැසට් නිවේදනය).<br>- සනීපාරක්ෂක තුවා සඳහා කිලෝ ග්‍රෑමයට සියයට 30ක් හෝ රු. 300.00 ක් ලෙස පැවති සෙස් බද්ද ඉවත් කිරීමට. |
| 2018.10.17 | 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, (2018.10.17 දිනැති අංක 2093/19 දරන ගැසට් නිවේදනය).<br>- රෙදි පිළි මත සෙස් බදු සංශෝධනය කිරීමට. |
| **ආදායම් බද්ද** | |
| **සංස්ථාපිත ආදායම් බද්ද** | |
| 2018.04.01 | - ස්තර තුනක ආදායම් බදු ප්‍රතිශතයන් හඳුන්වා දීමට.<br>- ***සියයට 28 සම්මත අනුපාතය*** - මූල්‍ය සේවා, රක්ෂණ, වෙළඳාම, නිෂ්පාදන සහ ඉහළ/සහනදායී බදු අනුපාතය යටතට නොගැනෙන ආදායම්<br>- ***සියයට 14 සහනදායී අනුපාතය*** - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, කෘෂිකාර්මික, අධ්‍යාපන සේවා, සංචාරක ප්‍රවර්ධන, තොරතුරු තාක්ෂණ සේවා, පුණ්‍ය ආයතන, සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ විශ්‍රාම අරමුදල්<br>- ***සියයට 40 ඉහළ අනුපාතය*** - ඔට්ටු හා සූදු, දුම්කොළ සහ මධ්‍යසාර |
| **පුද්ගලික ආදායම් බද්ද** | |
| 2018.04.01 | **පුද්ගලික ආදායම් බදු**<br>**බදු අයකළ හැකි ආදායම** — **බදු අනුපාතය**<br>පළමු 600,000 — 4%<br>600,000 - 1,200,000 — 8%<br>1,200,000 - 1,800,000 — 12%<br>1,800,000 - 2,400,000 — 16%<br>2,400,000 - 3,000,000 — 20%<br>3,000,000 ඉහළ — 24% |
| **සේවා නියුක්ති ආදායම් බද්ද** | |
| 2018.04.01 | - සේවා නියුක්ති ආදායම මත සියයට 24.0ක් දක්වා අනුක්‍රමිකව වැඩිවන අනුපාතයකට බදු අය කරන අතර බදු ස්තර පුළුල් කර ඇත.<br>- සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව රු. 250,000 සිට රු. 700,000 දක්වා වැඩි කරන ලදී.<br>- සේවාන්ත ලැබීම් සඳහා බදු කරණයේ කිසිදු වෙනසක් ඇති නොකරන ලදී. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | ද්විතීක සේවා නියුක්තියෘ<br>පළමු රු. 50,000 මාසිකවෘ 10%<br>ඉතිරිය : 20% |
| **රඳවා ගැනීමේ බද්ද** | |
| 2018.04.01 | **කාණ්ඩය** — **ප්‍රතිශතය**<br>බැංකු තැන්පතු මත පොලිය - ජ්‍යෙෂ්ඨ පුරවැසි — 5% (වාර්ෂික රු. මිලි. 1.5 ඉක්මවන මුදල)<br>අනිකුත් — 5%<br>සංස්ථාපිත ණය සුරැකුම්පත් මත පොලිය — 5%<br>රාජ්‍ය සුරකුම්පත් මත පොලිය — නැත<br>බදු කුලිය — 10%<br>විශේෂ ගාස්තු - රු. 50,000 ට වැඩි — 5%<br>හවුල් ව්‍යාපාර - එක් හවුල්කරුවන්ගේ කොටස — 8%<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසි මත මැණික් විකිණුම් — 2.5%<br>අනිකුත් (ලාභාංශ, රාජ්‍යභාග ආදිය) — 14% |
| **ප්‍රාග්ධන දීමනා ව්‍යුහය** | |
| 2018.04.01 | **විස්තරය** — **ප්‍රතිශතය**<br>පරිගණක සහ දත්ත හැසුරුම උපකරණ — 20%<br>වාහන — 20%<br>යන්ත්‍ර සූත්‍ර — 20%<br>ගොඩනැගිල්ල — 5%<br>කීර්තිනාමය ඇතුළුව අස්පෘශ්‍ය වත්කම් — සත්‍ය ප්‍රයෝජනවත් ආයුකාලය හෝ 5% |
| **ප්‍රාග්ධන ලාභ මත බද්ද** | |
| 2018.04.01 | ලැයිස්තුගත කොටස් හැර ඉඩම් හා ගොඩනැගිලි සහ අනෙකුත් ආයෝජන උපලබ්ධිවීමේ ලාභය මත සියයට 10 කිරීමට. |
| **ආයෝජන දිරිගැන්වීම් ක්‍රමය** | |
| 2018.04.01 | යම් තක්සේරු වසරක් තුළ අස්පෘශ්‍ය වත්කම් හැර ක්ෂය වන වත්කම් සඳහා වියදම් දරන යම් තැනැත්තෙකුට වැඩි කළ ක්ෂය දීමනා පදනම් කරගත් නව ආයෝජන දිරිගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දීමට. |
| 2018.07.30 | 2018 අංක 21 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධිත) පනත<br>- ඉඩම් පනත යටතේ විදේශිකයන් විසින් ඉඩම් මිල දී ගැනීමේ දී පැවති සීමා කිරීම් කොළඹ කොටස් වෙළෙඳපළලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ඉවත් කිරීමට.<br>- 4 වන මහලෙන් පහළ සහාධිපත්‍ය නිවාස ඒකක මිළ දී ගැනීම සම්බන්ධයෙන් විදේශිකයින්ට පැවති තහනම ඉවත් කිරීමට. |
| **ජාතිය ගොඩනැගීමේ බද්ද** | |
| 2018.07.30 | 2018 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ (සංශෝධිත) පනත<br>- මත්පැන් සම්බන්ධයෙන් පැවති ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් කිරීම ඉවත් කිරීමට.<br>- ජල ක්‍රීඩා සඳහා භාවිතා කරන මෝටරයකින් ක්‍රියාත්මක නොවන උපකරණ සහ උපාංග සහ කපා ඔප දමා අපනයනය උදෙසා මැණික් ගල් ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට.<br>- 2017.08.01 වන දිනට පෙර එළඹි ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ සපයන ඉදිකිරීම් සේවා ජාතිය ගොඩනැගීමේ බදු නිදහස් කිරීමට. |
| **එකතු කළ අගය මත බද්ද** | |
| 2018.08.16 | 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත<br>- කාමර ගාස්තු හැර පුද්ගලික වෛද්‍ය සේවා සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට.<br>- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මූල්‍යමය සේවා සැපයුම මත එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට.<br>- අපනයන අභිමුඛ සමාගම් දේශීය වෙළෙඳපළ තුළ අලෙවි කරන ඇතැම් ඇඟළුම් ඒකකයක් මත පදනම් වූ එකතු කළ අගය මත බද්ද නිදහස් කිරීමට.<br>- ළදරු කිරි පිටි, පොත්, සඟරා හා වාර ප්‍රකාශන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට. |

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | - පැළ හා මල්, රෙදි පිළි, දැව හා ආශ්‍රිත උපාංග සහ යන්ත්‍රෝපකරණ යනාදිය ඇතුළත් වූ භාණ්ඩ ආනයනය හෝ ආනයනය කර සැපයුම සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීමට.<br>- 2019.04.01 දින සිට සහාධිපත්‍යය නිවාස ඒකක විකුණුම් මත වූ එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීමට.<br>- සංචාරකයන් සඳහා එකතු කළ අගය මත බදු ප්‍රතිපූරණය කිරීමේ ක්‍රමවේදය හඳුන්වාදීමට. |
| 2018.09.18 | - සීනි ආනයනය හෝ ආනයනය කර සැපයුම මත එකතු කළ අගය මත බදු අනුපාතය 15% සිට 0% දක්වා අඩු කිරීමට. |
| 2018.11.01 | - රෙදි පිළි ආනයනයේ දී අය වන එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 0 කිරීමට. |
| 2018.11.01 | - ඉරන ලද දැව ආනයනයේ දී අය වන එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 5 දක්වා අඩු කිරීමට. |
| **වෙනත් බදු - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2018.01.01 | **වාහන හිමිකම් අය බද්ද** - 2018.12.31 වන දිනට පෙර වාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී වාහන ආනයන කරුවන් විසින් බැංකුවට මෙම අය බද්ද ගෙවීමට. |
| 2018.10.01 | වාර්ෂික සමාගම් ලියාපදිංචි කිරීමේ අය බද්ද - 2018 වසර සඳහා පමණක් අදාළ වේ.<br><br>**සමාගම් කාණ්ඩය** — **අනුප්‍රමාණය (වසරකට රු.)**<br>ලැයිස්තුගත පොදු සමාගම් — 1,500,000<br>පුද්ගලික සමාගම් — 30,000<br>වෙනත් යම් සමාගම් — 250,000 |
| 2018.10.01 | - ණය ආපසු ගෙවීමේ අය බද්ද |
| 2018.11.01 | - වාණිජ කේන්ද්‍රස්ථාන වලට අදාළ ප්‍රතිපාදන සංශෝධනය කිරීම |
| 2019.01.01 | - කාබන් බද්ද |
| 2019.01.01 | - දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද |
| 2019.01.01 | - ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද |
| 2019.01.01 | - සංචාරක සංවර්ධන බද්ද |
| **ආර්ථික සේවා ගාස්තු** | |
| 2018.09.20 | 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත<br>-මෝටර් රථ ආනයනයේ දී ආර්ථික සේවා ගාස්තු අයකිරීම සඳහා පදනම ලෙස ගෙවිය යුතු නිෂ්පාදන බද්ද සැලකීමට.<br>-ඉන්ධන තොග සැපයුම සම්බන්ධව ආර්ථික සේවා ගාස්තු අයකිරීමේ දී ගෙවිය යුතු නිෂ්පාදන බද්ද පිරිවැටුම ලෙස පිරිවැටුමෙන් 1/10 ක් අදාල පිරිවැටුම ලෙස සැලකීමට.<br>-ශ්‍රී ලංකා මහ බැංකුවේ උපලබ්ධි නොවූ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසි, ආර්ථික සේවා ගාස්තු වලින් නිදහස් කිරීමට. |
| **පරිපාලනමය ගාස්තු** | |
| 2018.04.28 | -කිලෝ ග්‍රෑම් 12.5ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 245.00 කින් ඉහළ දැමීමට. |
| 2018.05.05 | -කිරිපිටි සඳහා වූ සිල්ලර මිල රු. 50.00 කින් ඉහළ දැමීමට. |
| 2018.06.30 | -කිලෝ ග්‍රෑම් 12.5ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 138.00 කින් පහළ දැමීමට. |
| 2018.09.27 | -කිලෝ ග්‍රෑම් 12.5ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 195.00 කින් ඉහළ දැමීමට. |

## 2.3 රාජ්‍ය ආදායම් ප්‍රවණතා

### 2.3.1 රාජ්‍ය ආදායම

2018 වර්ෂයේදී ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රජය ගත් ක්‍රියා මාර්ග හේතුවෙන් රජයේ මුළු ආදායම 2017 වර්ෂයේ දී වූ රු. බිලියන 1,832ට සාපේක්ෂව 2018 වර්ෂයේදී රු. බිලියන 1,920 දක්වා සියයට 4.8කින් ඉහළ ගොස් තිබේ. මෙය 2018 වර්ෂය සඳහා වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 86.6ක් විය. සමස්ත බදු ආදායම 2017 වර්ෂයේදී වාර්තා වූ රු. බිලියන 1,670ට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රු. බිලියන 1,712ක් දක්වා සියයට 2.5කින් වර්ධනය විය. මේ අතර, බදු නොවන ආදායම රු. බිලියන 208ක් දක්වා සියයට 28.6කින් ලෙස කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. ඒ සඳහා විකුණුම් හා ගාස්තු සහ මහ බැංකුවෙන් ලද ලාභ පැවරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

සෘජු බදු ආදායම සැලකීමේදී ආදායම් බදු වලින් ලද ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී සැලකිය යුතු ලෙස රු. බිලියන 310 ක් දක්වා සියයට 13.1කින් ඉහළ ගොස් ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ බදු ප්‍රතිසංස්කරණ වලින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් වීමයි. මේ අතර, 2018 වර්ෂයේදී වක්‍ර බදු අනුපාතය ඉහළ නැංවීම සඳහා වන ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වශයෙන් එකතු කළ අගය මත බදු (VAT) සහ නිෂ්පාදන බදු ආදායම පවත්වා ගන්නා ලද අතර සෙස් සහ ආනයන බදු තුලින් ලද ආදායම හැරුණු විට අනෙකුත් ආදායම් මූලාශ්‍ර වල ඉහළ කාර්ය සාධනය ද මෙම වර්ධනය සඳහා හේතු විය.

**රූප සටහන 2.3.1.1 | බදු සහ බදු නොවන ආදායම 2011 - 2018**



වගුව 2.3.1.1 | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම - 2018

රු. මිලි.

| අයිතමය | ඇස්තමේන්තු | තත්‍ය | අපගමනය |
|---|---|---|---|
| **මුළු ආදායම** | **2,217,100** | **1,919,949** | **-297,151** |
| **බදු ආදායම** | **2,034,000** | **1,712,318** | **-321,682** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව** | | | |
| ආදායම් සහ ලාභ මත බදු | 371,800 | 310,449 | -61,351 |
| එකතු කළ අගය මත බදු - දේශීය (ශුද්ධ) | 340,000 | 282,487 | -57,513 |
| ජාතිය ගොඩනැගීමේ බදු (දේශීය) | 62,000 | 51,192 | -10,808 |
| **උප එකතුව** | **773,800** | **644,128** | **-129,672** |
| **රේගු දෙපාර්තමේන්තුව** | | | |
| ආනයන බදු | 175,000 | 96,991 | -78,009 |
| එකතු කළ අගය මත බදු - ආනයන (ශුද්ධ) | 210,000 | 179,163 | -30,837 |
| ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන | 25,000 | 20,165 | -4,835 |
| වරාය ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 115,000 | 113,950 | -1,050 |
| සෙස් බදු | 49,500 | 53,369 | 3,869 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 80,000 | 75,807 | -4,193 |
| නිෂ්පාදන (විශේෂ විධිවිධාන බදු) | 410,000 | 370,298 | -39,702 |
| දුම්වැටි | 90,000 | 92,198 | 2,198 |
| ඛනිජ තෙල | 80,000 | 66,318 | -13,682 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 240,000 | 211,782 | -28,218 |
| **උප එකතුව** | **1,064,500** | **909,743** | **-154,757** |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | | | |
| මත්පැන්/දුම්කොළ | 125,040 | 113,989 | -11,051 |
| **උප එකතුව** | **125,040** | **113,989** | **-11,051** |
| **අනෙකුත්** | **70,660** | **44,457** | **-26,203** |
| විදුලි සංදේශ බද්ද | 30,000 | 28,326 | -1,674 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 40,660 | 16,131 | -24,529 |
| **උප එකතුව** | **70,660** | **44,457** | **-216,561** |
| **බදු නොවන ආදායම** | **183,100** | **207,631** | **24,531** |

*මූලාශ්‍රයː රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

වගුව 2.3.1.2 | රාජ්‍ය ආදායම

රු. මිලි.

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **1,005,895** | **1,050,362** | **1,355,779** | **1,463,689** | **1,670,178** | **1,712,317** |
| ආදායම් බදු | 205,666 | 198,115 | 262,583 | 258,857 | 274,562 | 310,449 |
| එකතු කළ අගය මත බදු | 250,523 | 275,350 | 219,700 | 283,470 | 443,739 | 461,651 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 40,937 | 44,583 | 45,004 | 57,424 | 69,035 | 71,357 |
| නිෂ්පාදන බදු | 250,700 | 256,690 | 497,623 | 454,952 | 469,454 | 484,287 |
| ආනයන බදු | 83,123 | 81,108 | 132,189 | 156,487 | 136,501 | 96,991 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 61,987 | 68,646 | 58,644 | 88,823 | 102,360 | 113,950 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 46,705 | 47,953 | 52,276 | 55,825 | 71,402 | 75,807 |
| අනෙකුත් | 66,255 | 77,917 | 87,760 | 107,851 | 103,125 | 97,826 |
| **බදු නොවන ආදායම** | **131,552** | **144,844** | **99,099** | **222,372** | **161,353** | **207,631** |
| පොලී/කුලී | 11,995 | 13,647 | 7,321 | 15,806 | 11,845 | 13,743 |
| ලාභ සහ ලාභාංශ | 35,169 | 46,814 | 29,798 | 108,160 | 53,998 | 41,828 |
| විකුණුම් සහ ගාස්තු | 40,720 | 35,499 | 44,632 | 72,606 | 66,575 | 105,204 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 15,145 | 14,919 | 15,213 | 18,046 | 22,940 | 25,214 |
| මහ බැංකු පැවරුම් | 26,350 | 11,500 | - | 5,000 | - | 15,000 |
| අනෙකුත් | 2,173 | 22,466 | 2,135 | 2,754 | 5,995 | 6,642 |
| **මුළු ආදායම** | **1,137,447** | **1,195,206** | **1,454,878** | **1,686,061** | **1,831,531** | **1,919,949** |
| | | | **ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස** | | | |
| **බදු ආදායම** | **10.5** | **10.1** | **12.4** | **12.3** | **12.6** | **11.9** |
| ආදායම් බදු | 2.1 | 1.9 | 2.4 | 2.2 | 2.1 | 2.2 |
| එකතු කළ අගය මත බදු | 2.6 | 2.7 | 2.0 | 2.4 | 3.3 | 3.2 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 0.4 | 0.4 | 0.4 | 0.5 | 0.5 | 0.5 |
| නිෂ්පාදන බදු | 2.6 | 2.5 | 4.5 | 3.8 | 3.5 | 3.4 |
| ආනයන බදු | 0.9 | 0.8 | 1.2 | 1.3 | 1.0 | 0.7 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 0.6 | 0.7 | 0.5 | 0.7 | 0.8 | 0.8 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 0.5 | 0.5 | 0.5 | 0.5 | 0.5 | 0.5 |
| අනෙකුත් | 0.7 | 0.8 | 0.8 | 0.9 | 0.8 | 0.7 |
| **බදු නොවන ආදායම** | **1.4** | **1.4** | **0.9** | **1.9** | **1.2** | **1.4** |
| පොලී/කුලී | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| ලාභ සහ ලාභාංශ | 0.4 | 0.5 | 0.3 | 0.9 | 0.4 | 0.3 |
| විකුණුම් සහ ගාස්තු | 0.4 | 0.3 | 0.4 | 0.6 | 0.5 | 0.7 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 0.2 | 0.1 | 0.1 | 0.2 | 0.2 | 0.2 |
| මහ බැංකු පැවරුම් | 0.3 | 0.1 | - | … | - | - |
| **මුළු ආදායම** | **11.9** | **11.5** | **13.3** | **14.2** | **13.8** | **13.4** |

*මූලාශ්‍රය:රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*--- සැලකිය යුතු නොවේ*

*- ලැබී නොමැත*

**2.3.1.3** වගුව | රජයේ බදු ආදායම -ප්‍රභවයන් අනුව

*රු.මිලි.*

| මූලාශ්‍රය | 2017 | 2018 (තාවකාලික) | 2017/2018 වෙනස (%) |
|---|---|---|---|
| **ආදායම් බදු** | **274,562** | **310,450** | **13.1** |
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු | 143,588 | 169,672 | 8.2 |
| උපයන විට ගෙවීමේ බදු | 32,920 | 41,385 | 25.7 |
| ආර්ථික සේවා ගාස්තු | 44,720 | 52,979 | 18.5 |
| පොලී මත බදු | 53,334 | 46,414 | (13.0) |
| **දේශීය පරිභෝජනය මත පදනම්වූ බදු** | **530,860** | **547,567** | **3.1** |
| එකතු කළ අගය මත බදු‍ දේශීය | 275,367 | 282,487 | 2.6 |
| ජාතිය ගොඩනැගීමේ බදු‍ දේශීය | 49,716 | 51,192 | 3.0 |
| සුරා බදු | 113,684 | 113,944 | 0.2 |
| දුම්වැටි සහ දුම්කොළ මත බදු | 86,002 | 92,243 | 7.3 |
| අනෙකුත් (නිෂ්පාදන)බදු | 6,091 | 7,701 | 26.4 |
| **ආනයනය මත පදනම් වූ බදු** | **821,253** | **809,844** | **(1.4)** |
| ආනයන බදු | 136,501 | 96,991 | (28.9) |
| එකතු කළ අගය මත බදු‍ ආනයන | 168,393 | 179,163 | 6.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු‍ ආනයන | 19,320 | 20,165 | 4.4 |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 102,360 | 113,950 | 11.3 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩබදු | 71,402 | 75,807 | 6.2 |
| සෙස් බදු | 59,554 | 53,369 | (10.4) |
| ඛනිජ තෙල් නිෂ්පාදන බදු | 73,983 | 66,318 | (10.4) |
| මෝටර් වාහන නිෂ්පාදන බදු | 189,740 | 204,081 | 7.6 |
| **බලපත්‍ර සහ අනෙකුත්** | **43,504** | **44,457** | **2.2** |
| විදුලි සංදේශ බදු | 33,399 | 28,326 | (15.2) |
| අනෙකුත් | 10,105 | 16,131 | 59.6 |
| **මුළු බදු ආදායම** | **1,670,178** | **1,712,318** | **2.5** |

*මූලාශයඃ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### 2.3.2 බදු ආදායම

බදු ආදායම සියයට 2.5 කින් රු. බිලියන 1,712 දක්වා ඉහළ ගොස් බදු පදනම පුළුල් වී තිබේ. ඔටෝ ඩීසල් සඳහා නිෂ්පාදන බදු අත්හැරීම් හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු වලින් ලැබෙන ආදායම 2018 වර්ෂයේ දී පහත වැටිණ.

**ආදායම් බදු**

සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු (Corporate and None-Corporate Tax) , උපයන විට ගෙවීම් (PAYE), ආර්ථික සේවා ගාස්තු (ESC), පොළී ආදායම මත රඳවාගැනීමේ බදු ආදායම සහ ප්‍රාග්ධන ලාභ බදු යන බදු වලින් ලද මුළු ආදායම 2017 වර්ෂයේ දී ලද රු. බිලියන 274.6 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී රු. බිලියන 310.5 ක් දක්වා සියයට 13.1 කින් ඉහළ ගොස් තිබේ. උපයන විට ගෙවීම් බදු වලින් ලද ආදායම 2017 වර්ෂයේදී රු. බිලියන 32.9 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී රු. බිලියන 41.4 ක් දක්වා සියයට 25.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. ඒ සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශවල වැටුප් වැඩිවීම හේතු වී ඇත.

කෙසේ වුවද, පොළී ආදායම මත බදු 2017 වර්ෂයේදී වාර්තා වූ රු. බිලියන 53.3 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී රු. බිලියන 46.4 දක්වා සියයට 13 කින් අඩු වී ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් රජයේ සුරකුම්පත් නිකුත් කිරීමේ අන්‍යොන්‍ය පහත වැටීම බලපා ඇත. 2018 වර්ෂයේදී මුළු ඇස්තමේන්තුගත ආදායම් බදු ආදායම රු. බිලියන 372 ක් වූ අතර ඉන් රු. බිලියන 310.5 ක ආදායමක් ලගා කර ගන්නා ලදී.

රූප සටහන 2.3.2.1 | සෘජු බදු 2011 - 2018




**2.3.2.1** වගුව | ආදායම් බදු කාර්යසාධනය

*රු. මිලි.*

| අයිතමය | 2016 | 2017 | 2018 (තාවකාලික) | වර්ධනය % |
|---|---|---|---|---|
| **ආදායම් බදු** | **258,857** | **274,562** | **310,449** | **13.1** |
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු | 154,324 | 143,588 | 169,672 | 18.2 |
| උපයන විට ගෙවීමේ බදු | 28,169 | 32,920 | 41,385 | 25.7 |
| ආර්ථික සේවා ගාස්තු | 20,458 | 44,720 | 52,979 | 18.5 |
| පොලිය මත රඳවා ගැනීමේ බදු | 55,906 | 53,334 | 46,414 | -13.0 |

** රු. බිලියන 49.8 ක සුපිරි වාසි බද්දක් අන්තර්ගත වේ*

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රූප සටහන 2.3.2.2 | **ආදායම් බදු කාර්යසාධනය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**එකතු කළ අගය මත බද්ද**

2018 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 461.6 දක්වා සියයට 4.0කින් 2017 වසරේ එම කාලයට සාපේක්ෂව දළ වශයෙන් ඉහළ ගොස් ඇත. 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 550කි. දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බදු ආදායම වර්ෂය තුල්දී සියයට 2.6කින් රු. බිලියන 282.5ක් දක්වා ඉහළ ගොස් ඇති අතර ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම සියයට 6.4 කින් රු. බිලියන 179ක් දක්වා සමස්ථ වර්ෂය තුළ ඉහළ ගොස් ඇත. සෞඛ්‍ය සේවා සඳහා නිදහස් කිරීම් ලබාදී තිබියදී වුවද රෙදි, දැව, ගුවන් යානා සහ අමතර කොටස් සහ කැමරා සහ ප්‍රක්ශේපණ යන්ත්‍ර ආදී තෝරාගත් අයිතම සඳහා ලබා දී තිබූ නිදහස් කිරීම් ඉවත් කිරීම මෙම කාර්යසාධනය සඳහා හේතු විය.

2.3.2.2 වගුව | **එකතු කළ අගය මත බදු ආදායම**

*රු.මිලි.*

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 (තාවකාලික) |
|---|---|---|---|---|---|---|
| දේශීය | 124,658 | 140,413 | 131,662 | 168,817 | 276,065 | 283,330 |
| ආනයන | 126,538 | 136,221 | 89,174 | 115,339 | 168,393 | 179,123 |
| **දළ ආදායම** | **251,196** | **276,634** | **220,836** | **284,156** | **444,459** | **462,453** |
| ආපසු ගෙවීම | 439 | 1,284 | 1,136 | 686 | 720 | 802 |
| **ශුද්ධ ආදායම** | **250,757** | **275,350** | **219,700** | **283,470** | **443,739** | **461,651** |
| **ශුද්ධ ආදායම ද.දේ.නි. % ලෙස** | **2.6** | **2.7** | **2.0** | **2.4** | **3.3** | **3.2** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රූප සටහන 2.32.2 | වක්‍ර බදු 2011 - 2018




**වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද**

2018 වර්ෂයේදී වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම රු. බිලියන 114 දක්වා 2017 වසරේදී වාර්තා වූ රු. බිලියන 102.4ට සාපේක්ෂව සියයට 11.3 ඉහළ ගොස් ඇත. 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත මුළු වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම රු. බිලියන 115 කි.

**නිෂ්පාදන බදු**

2018 වර්ෂයේ දී නිෂ්පාදන බදු වලින් ලද ආදායම 2017 වර්ෂයේ ලද රු. බිලියන 469.5ට සාපේක්ෂව රු. බිලියන 484.3ක් දක්වා එනම් සියයට 3.1 කින් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. මේ සඳහා මෝටර් වාහන මඟින් ඉපැයූ ආදායම ඉහළ යාම උපකාරී වී ඇත. කෙසේ වෙතත්, 2018 වර්ෂයේ දී මත්පැන් වලින් ඉපයූ ආදායම සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. මෙලෙස නිෂ්පාදන බදු ආදායම වැඩිවීමේ මධ්‍යස්ථ ප්‍රවණතාවයක් පැවතිය අතර නිෂ්පාදන බදු ආදායම මුළු බදු ආදායමට සියයට 28.3ක දායකත්වයක් දරමින් එය තවදුරටත් බදු ආදායමේ ප්‍රධානතම මූලාශ්‍රයක් ලෙස 2018 වර්ෂයේ දී පැවතුණි. මත්පැන් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2017 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 113.7කට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රු. බිලියන 113.9ක් දක්වා සියයට 0.2කින් සුළු වශයෙන් ඉහළ යන ලදී.

කෙසේ වෙතත්, ධාන්‍ය මත්පැන් හා සැර මත්පැන් සඳහා වූ සුරා බදු අනුපාතිකයන් අඩු කිරීම හේතුවෙන් ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සියයට 72කින් වැඩි වී සම්මත සැර ලීටර් මිලියන 121ක් වූ අතර සැර මත්පැන් නිෂ්පාදන සම්මත සැර ලීටර් මිලියන 25.3ක් දක්වා සියයට 11.2කින් අඩු විය. 2018 වර්ෂයේ දී මත්පැන් හා සිගරැට් නිෂ්පාදන මත ඇස්තමේන්තු ගත සුරා බදු ආදායම රු. බිලියන 215ක් වුව ද එම වර්ෂයේ දී ළඟා කර ගත හැකි වූයේ රු. බිලියන 206.2ක් පමණි. දුම්කොළ සහ මද්‍යසාර පරිභෝජනය අධෛර්යමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම හේතුවෙන් සුරා බදු ආදායමේ හි ඉලක්කගත ආදායම කරා ළඟා වීමට නොහැකි විය.

මෝටර් වාහන ආනයනය මගින් ලද නිෂ්පාදන බදු ආදායම 2017 වර්ෂයේ වාර්තා වූ බිලියන 189.7ට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රු. බිලියන 204.1ක් දක්වා සියයට 7.6කින් වර්ධනය වී ඇත. 2017 වර්ෂයේ ආනයනය කරන ලද මෝටර් රථ 460, 261ට සාපේක්ෂව 2018 වර්ෂයේ ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව 494,488 දක්වා සියයට 7.4කින් වර්ධනය විය. එබැවින්, 2018 අයවැය මඟින් මෝටර් වාහන මත වූ නිෂ්පාදන බදු ඉහළ දැමීම සහ 2018 වර්ෂයේ ආනයනය කළ මෝටර් වාහන සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් එම වර්ෂයේ මෝටර් වාහන මඟින් ඉපයූ නිෂ්පාදන බදු ආදායම ඉහළ යන ලදී. 2018 වර්ෂය තුළ දී මෝටර් වාහන මත වූ ඇස්තමේන්තු ගත නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 230ක් වුවද එම වර්ෂය තුළ දී ළඟා කර ගත හැකි වූයේ සියයට 88.7ක් පමණි.

මේ අතරතුර, සෞඛ්‍යයට අහිතකර පාරිභෝජන පුරුදු අධෛර්මත් කිරීම සඳහා 2017 නොවැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි සීනි සංයුතිය අනුව කාබනේට් පානයන් මත ද ප්ලාස්ටික් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන වල අධි භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ප්ලාස්ටික් රෙසින මත ද නිෂ්පාදන බදු පැනවීම සිදු විය.

සිගරැට් සහ දුම්කොළ මත ආදායම 2017 වර්ෂයේ දී වාර්තා වූ රු. බිලියන 86ට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රු. බිලියන 92.2 දක්වා සියයට 7.3කින් ඉහළ ගොස් ඇති අතර 2018 වර්ෂයේ දී සිගරැට් පරිභෝජනය ආසන්න වශයෙන් මිලියන 3,150ක ස්ථාවර අගයක් ව පැවතී ඇත.

මේ අතර ඛනිජතෙල් නිෂ්පාදන මත ලද ආදායම 2017 වර්ෂයේ දී වාර්තා වූ රු. බිලියන 74.0 සාපේක්ෂව 2018 වර්ෂයේ සියයට 10.4කින් රු. බිලියන 66.3ක් දක්වා සැලකිය යුතු අන්දමින් පහළ ගොස් තිබේ.

රූප සටහන 2.3.2.4 | **දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම**




රූප සටහන 2.3.2.5 | **මත්පැන් නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම**




*සටහන : 2016 වර්ෂයෙන් පසුව සැර මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ අගය මත පදනම් වී ඇත.*
*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්මේන්තුව සහ සුරා බදු දෙපාර්තමේන්තුව*

**2.3.2.3** වගුව | මත්පැන් හා දුම්වැටි නිෂ්පාදනය සහ සුරාබදු/නිෂ්පාදන බදු ආදායම්

| වර්ෂය | නිෂ්පාදනය | | | | | | සුරා බදු/නිෂ්පාදන බදු ආදායම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැර මත්පැන් (ලීටර් මිලියන) | ප්‍රතිශතක වෙනස | බීර නිෂ්පාදනය (ලීටර් මිලියන) | ප්‍රතිශතක වෙනස | දුම්වැටි (මිලියන) | ප්‍රතිශතක වෙනස | මත්පැන් (රු.බිලියන) | ප්‍රතිශතක වෙනස | දුම්වැටි (රු.බිලියන) | ප්‍රතිශතක වෙනස |
| 2011 | 53.8 | 8.9 | 87.5 | 22.5 | 4,469 | 4.3 | 55.8 | 48.0 | 49.6 | 22.2 |
| 2012 | 49.7 | -7.6 | 99.3 | 13.5 | 4,360 | -3.3 | 60.1 | 7.7 | 53.9 | 8.7 |
| 2013 | 44.2 | 11.1 | 120.2 | 21.0 | 4,035 | -6.6 | 66.0 | 9.8 | 58.6 | 8.7 |
| 2014 | 43.9 | -0.6 | 124.5 | 3.6 | 3,777 | -6.4 | 69.1 | 4.6 | 57.2 | -2.3 |
| 2015 | 51.8 | 17.9 | 125.8 | 1.0 | 4,116 | 9.0 | 105.2 | 52.3 | 80.0 | 39.9 |
| 2016 | 55.6 | 7.3 | 52.2 | (58.5) | 3,789 | -7.9 | 120.2 | 14.3 | 88.8 | 11.0 |
| 2017 | 46.9 | 15.5 | 71.1 | 36.3 | 3,149 | -16.9 | 113.7 | -5.4 | 86.0 | -3.2 |
| 2018 | 44.4 | -5.4 | 121.1 | 70.4 | 3,150 | 0.0 | 113.9 | 0.2 | 92.2 | 7.2 |

*මූලාශ්‍ර: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව*

**2.3.2.4** වගුව | මෝටර් රථ වාහන ආනයනය

| අයිතමය | මෝටර්රථ වාහන සංඛ්‍යාව | | | | ප්‍රතිශතක වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** | **2015** | **2016** | **2017** | **2018** |
| යතුරුපැදි | 349,441 | 329,978 | 364,346 | 354,998 | 8.4 | -5.6 | 10.4 | -2.6 |
| ත්‍රිරෝද රථ | 132,865 | 47,976 | 19,021 | 20,782 | 59.6 | -63.9 | -60.4 | 9.3 |
| ට්‍රැක්ටර් | 14,233 | 13,185 | 10,295 | 6,992 | 158.3 | -7.4 | -21.9 | -32.1 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 44,218 | 32,161 | 25,964 | 25,077 | 72.3 | -27.3 | -19.3 | -3.4 |
| මගී ප්‍රවාහන වෑන් සහ බස් රථ | 4,687 | 2,849 | 3,732 | 2,581 | 20.0 | -39.2 | 31.0 | -30.8 |
| මෝටර් කාර් | 108,866 | 42,208 | 36,131 | 83,269 | 165.3 | -61.2 | -14.4 | 130.5 |
| අනෙකුත් | 510 | 948 | 772 | 789 | 26.9 | 85.9 | -18.6 | 2.2 |
| **එකතුව** | **654,820** | **469,305** | **460,261** | **494,488** | **35.9** | **-28.3** | **-1.9** | **7.4** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

**ආනයන බදු**

2018 වර්ෂය තුළ ආනයන බදු මගින් ලද ආදායම සියයට 28.9කින් රු. බිලියන 96.9ක් දක්වා පහත වැටී ඇත. මෙම ආදායමේ පහත වැටීම් ආසන්න වශයෙන් රු. බිලියන 39ක් වන අතර 2018 වර්ෂයේ ආනයන තීරු බදු මගින් රැස්කරගත හැකි වූයේ 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ රු. බිලියන 175ක ආනයන තීරු බදු ආදායමින් සියයට 55.4 කි. පෙට්‍රල් සහ ඩීසල් සඳහා ලබා දුන් ආනයන තීරු බදු සහන හා පෙට්‍රල් හා ඩීසල් ආනයනයේ පහත වැටීම මෙම ආනයන තීරු බදු ආදායමේ පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

**විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද**

දේශීය නිෂ්පාදන දිරිගැන්වීම හා අවාර කාලයේ සිදුවන මිල ඉහළ යාමෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ අරමුණු ඇතිව අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සංඛ්‍යාවක් සඳහා 2007 වර්ෂයේ දී 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත හඳුන්වා දෙන ලදි. විශේෂ වෙළඳ භාණ්ඩ බදු මඟින් ලද 2017 වර්ෂයේ රු. බිලියන 71.4 ක ආදායම 2018 වර්ෂයේ රු. බිලියන 75 ක් දක්වා සියයට 6.2 කින් වැඩි වී ඇත. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම, 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ රු. බිලියන 80 ක්වූ ආදායමට වඩා ආසන්න වශයෙන් රු. බිලියන 5 කින් පහළ අගයක් ගනී. සුදු හා දුඹුරු සීනි මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දැමීම නිසා සහ ආනයන ඉහළ යෑම නිසා සුදු හා දුඹුරු සීනි මගින් ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම සැළකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ලොකු ලූණු මත විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය පහත හෙලීම හේතුවෙන් ලොකු ලූණු මගින් ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම සැලකිය යුතු ලෙස පහළ යන ලදී.

රූප සටහන 2.3.2.6 | ආනයන සහ අපනයන බදු



**2.3.2.5 වගුව** | විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත

| අයිතමය | බදු අනුපාතය (කි.ග්‍රෑමයට රු.) | |
|---|---|---|
| | 2017 වසර අවසානයේ දී | 2018 වසර අවසානයේ දී |
| 1. හාල් මැස්සන් | 1 | 1 |
| 2. අල | 1 | 20 |
| 3. රතු ළූණු | 25 | 25 |
| 4. බී ළූණු | 1 | 20 |
| 5. සුදු ළූණු | 40 | 40 |
| 6. මුං ඇට | 40 | 40 |
| 7. පරිප්පු - සම්පූර්ණ | 1 | 2 |
| පියළි කළ | 3 | 7 |
| 8. මිරිස් - කුඩු නොකළ | 25 | 25 |
| කුඩු කළ | 125 | 125 |
| 9. ටින් මාළු | 50 | 50 |
| 10. සීනි සුදු | 31 | 32 |
| දුඹුරු | 33 | 35 |
| 11. වටානා - සම්පූර්ණ | 15 | 5 |
| පියළි කළ | 18 | 8 |
| 12. කඩල - සම්පූර්ණ | 7 | 2 |
| පියළි කළ | 10 | 5 |
| 13. තද දුඹුරු පැහැති කඩල | 60 | 125 |
| 14. කව්පි | 70 | 70 |
| 15. මෙනේරි / වෙනත් | 70 | 70 |
| 16. උම්බලකඩ | 102 | 102 |
| 17. කරවල | 52 | 52 |
| 18. දොඩම් නැවුම් | 65 | 65 |
| 19. මිදි නැවුම් | 130 | 130 |
| 20. ඇපල් නැවුම් | 45 | 45 |
| 21. කොත්තමල්ලි - නොඇඹරූ හෝ කුඩු නොකළ | 26 | 26 |
| කොත්තමල්ලි - ඇඹරූ හෝ කුඩු කළ | 52 | 52 |
| 22. සූදුරු බීජ | 162 | 162 |
| 23. මහදුරු බීජ | 162 | 162 |
| 24. කහ - නොඇඹරූ හෝ කුඩු නොකළ | 102 | 102 |
| කහ - අනෙකුත් | 360 | 360 |
| 25. උළුහාල් | 50 | 50 |
| 26. කුරක්කන් | 70 | 70 |
| කුරක්කන් පිටි | 150 | 150 |
| 27. තද දුඹුරු පැහැති කඩල පිටි | 200 | 200 |
| 28. රටකජු පොත්ත සහිත | 112 | 112 |
| 29. අබ | 62 | 62 |

## 2.3.2.5 වගුව | විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත

| අයිතමය | බදු අනුපාතය (කි.ග්‍රෑමයට රු.) | |
|---|---|---|
| | 2017 වසර අවසානයේ දී | 2018 වසර අවසානයේ දී |
| 30. පාම් තෙල් / එළවළු තෙල් - පිරිපහදු නොකළ | 110 | 150 |
| පාම් තෙල් / එළවළු තෙල් - පිරිපහදු කළ | 135 | 170 |
| පාම් මදයෙන් ලබාගත් තෙල් - පිරිපහදු නොකළ | 130 | 170 |
| පාම් මදයෙන් ලබාගත් තෙල් - පිරිපහදු කළ | 145 | 185 |
| පාම් ඕලීන් - පිරිපහදු නොකළ | 115 | 155 |
| පාම් ඕලීන් - පිරිපහදු කරන ලද | 135 | 175 |
| පොල් තෙල් (පිරිපහදු නොකළ/ පිරිපහදු කළ ) | 130 | 150 |
| 31. මාළු | CIF අගයෙන් 10% හෝ කි.ග්‍රෑමයට රු.100 යන අගයන්ගෙන් වැඩි අගය | CIF අගයෙන් 10% හෝ කි.ග්‍රෑමයට රු.100 යන අගයන්ගෙන් වැඩි අගය |
| 32. මැකරල් | 6 | 6 |
| 33. යෝගට් | 625 | 625 |
| 34. බටර් | 880 | 880 |
| 35. මාගරින් (මේද සියයට 80 හෝ ඊට වැඩි) | 215 | 215 |
| මාගරින් - අනෙකුත් | 315 | 315 |
| 36. ලූණු | 40 | 40 |
| 37. රටඉඳි | 60 | 60 |
| 38. වියළි මිදි | 230 | 230 |
| 39. මැන්ගුස්ටීන් | 200 | 200 |
| 40. වියළි දොඩම් | 200 | 200 |
| 41. පෙයාර්ස් | 175 | 175 |
| 42. චෙරීස් | 250 | 250 |
| 43. ප්ලම්ස් සහ ස්ලෝස් | 200 | 200 |
| 44. කිවි ෆෘට් | 175 | 175 |
| 45. දෙළුම් (අනෙකුත්) | 200 | 200 |
| 46. චීස් | | 200 |
| 47. බඩ ඉරිඟු | 10 | 10 |
| 48. සහල් (සම්බා, කැකුළු,නිවිඩු සහල්, සුදු සහල්, ) | 0.25 | - |
| 49. පොල් මද | 1 | - |

*මූලාශ්‍රය : වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**2017.12.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි තලපත්, කොප්පරා සහ තෝර මාළු සඳහා බද්ද කිලෝ ග්‍රෑමයට රු.25 කි.*

**ජාතිය ගොඩනැඟීමේ බද්ද**

2017 වර්ෂයේ ඉපැයූ රු. බිලියන 69.0ට සාපේක්ෂව 2018 වර්ෂයේ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම රු. බිලියන 71.4 දක්වා ඉහළ යන ලදී. දේශීය ක්‍රියාකාරකම් මත වූ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම රු. බිලියන 51.2ක් දක්වා සියයට 3.0කින් ඉහළ යන ලද අතර ආනයන මත වූ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම සියයට 4.4ක සුළු වර්ධනයක් සහිතව රු. බිලියන 20.2ක් විය. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට, නිවාස සංකීර්ණ මත වූ නිවාස ඒකක විකිණීම සහ බැංකු හරහා විදේශ මුදල් හුවමාරු කරගන්නා චාරිකා නියෝජිත ආයතන මත වූ ජාතිය ගොඩනැඟීමේ බදු සහන ඉවත් කිරීම මේ සඳහා ඉවහල් විය. බදු ක්‍රමය සරල කිරීමේ අරමුණින් 2011 වර්ෂයේදී හඳුන්වා දුන් ආදායම් මාරු කිරීමේ ක්‍රමවේදය යටතේ 2018 වර්ෂයේ දී රු. බිලියන 35.7ක් පළාත් සභා වෙත මාරු කරන ලදී. 2018 වසරේ ඇස්තමේන්තුගත ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම රු. බිලියන 87ක් විය.

**2.3.2.6 වගුව | පළාත් සභා වෙත පවරනු ලැබූ ජාතිය ගොඩනැඟීමේ බදු ආදායම - 2018**

| පළාත් සභාව | ආදායම (රු.මිලියන) | මුළු අගයෙන් % |
|---|---|---|
| බස්නාහිර පළාත | 17,126 | 48 |
| මධ්‍යම පළාත | 3,211 | 9 |
| දකුණු පළාත | 3,211 | 9 |
| වයඹ පළාත | 3,211 | 9 |
| සබරගමුව පළාත | 1,784 | 5 |
| උතුරු මැද පළාත | 1,784 | 5 |
| ඌව පළාත | 1,784 | 5 |
| නැගෙනහිර පළාත | 1,784 | 5 |
| උතුරු පළාත | 1,784 | 5 |
| **එකතුව** | **35,679** | **100** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**සෙස් බද්ද**

සෙස් බදු ලෙස 2018 වසරේ රු. බිලියන 53.37ක ආදායමක් රැස් කරන ලද අතර, එය 2017 වසරේ රැස් කරන ලද රු. බිලියන 59.55ක ආදායමට සාපේක්ෂව සියයට 10.4කින් අඩු වූ අතර සමස්ත බදු ආදායමෙන් සියයට 3.1ක් විය. 2017 වසරේ දී ආනයන මත අයකරන ලද සෙස් බදු ආදායම සියයට 10.24කින් රු. බිලියන 50.78 ක් දක්වා අඩු වූ අතර මේ සඳහා මස්, කිරි නිෂ්පාදන, රටඉදි, මිදි, පෙයාර්ස්, බියර්, සහ වයින් යනාදී හඳුනාගත් අයිතම 253ක් මත පනවා තිබූ අදාළ සෙස් බද්ද ඉවත් කිරීම හේතු විය. කෘෂිකාර්මික , කාර්මික සහ ඛනිජ අපනයන පහළ යාම නිසා 2018 වර්ෂයේ අපනයන සෙස් බදු ආදායම රු. බිලියන 2.6ක් දක්වා සියයට 10.35කින් අඩු විය. කෙසේ වූව ද 2018 වසරේ ඇස්තමේන්තුගත සෙස් බදු ආදායම රු. මිලියන 53.37 ක් වන අතර එයින් රු. මිලියන 49.50ක් ළඟා කර ගැනීමට හැකිවිය.

**2.3.2.7 වගුව | ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු මඟින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර : 2016-2018**

රු.මිලියන

| අයිතම | 2016 | 2017 | 2018(අ) | අයිතම | 2016 | 2017 | 2018(අ) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන සෙස් බද්ද** | **2,672** | **2,980** | **2,592** | **වානිජ භෝග සංවර්ධනය** | | | |
| තේ - තේ (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 587 | 550 | 591 | තේ | 549 | 445 | 615 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 10 | 90 | 10 | රබර් | 713 | 703 | 579 |
| පොල් - පොල් සංවර්ධන පනත යටතේ | 141 | 105 | 107 | පොල් | 709 | 598 | 653 |
| අ.සං.ම. සෙස් බද්ද අපනයන සංවර්ධන පනත යටතේ | 1,832 | 2,235 | 1,884 | කජු | 40 | 54 | 67 |
| **ආනයන මත සෙස් බද්ද** | | | | සුළු අපනයන භෝග -කුරුඳු, කොකෝවා,කෝපි,ගම්මිරිස් | 380 | 336 | 440 |
| ආනයන ශ්‍රී ලංකා සෙස් බද්ද අපනයන සංවර්ධන පනත යටතේ | 59,08 | 56,574 | 50,777 | සමස්ත කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා පොහොර සහනාධාරය | 27,771 | 30,361 | 26,879 |
| **එකතුව** | **61,70** | **59,554** | **53,369** | **එකතුව** | **30,162** | **32,497** | **29,233** |

*මූලාශ්‍ර : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**විදුලි සංදේශ බදු**

2018 වර්ෂයේ විදුලි සංදේශ බදු ආදායම රු. බිලියන 28.3 කි. එය 2017 වර්ෂයේ වාර්තා කළ රු. බිලියන 33.4ට සාපේක්ෂව සියයට 15.2ක අඩු වීමකි. අන්තර්ජාල සේවා සඳහා බදු ඉවත් කිරීම සහ ඇමතුම් කාලසීමාව පහත වැටීම මේ සඳහා හේතු විය.

### 2.3.3 බදු නොවන ආදායම

බදු නොවන ආදායම, 2017 වසරේ දී වාර්තා වූ රු. බිලියන 161.4ට සාපේක්ෂව 2018 වසරේ දී රු. බිලියන 207.6 දක්වා සියයට 28.7කින් වැඩි වී ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ලාභ හා ලාභාංශ හැර අනිකුත් සියලු උප අංශයන්ගේ වැඩි වීම හේතු වී තිබේ. පෙර වර්ෂයට සාපේක්ෂව කුලී ආදායම සියයට 25.6කින් රු. බිලියන 5.6 දක්වා ද, සමාජ ආරක්ෂණ දායක අරමුදල් මගින් ලද ආදායම සියයට 9.9කින් රු. බිලියන 25.2 දක්වා ද සහ පොලී ආදායමින් ලද බදු නොවන ආදායම රු. බිලියන 8.2 දක්වා සියයට 10.3 දක්වා ද සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. තව දුරටත්, විකුණුම් සහ ගාස්තු ආදායම 2017 වසරේ දී වාර්තා වූ රු. බිලියන 66.6ට සාපේක්ෂව 2018 වසරේ දී රු. බිලියන 105.2 දක්වා සියයට 58.0කින් වැඩි වී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායයන් මගින් ලද ලාභ සහ ලාභාංශ 2017 වසරේ දී වාර්තා වූ රු. බිලියන 54.0ට සාපේක්ෂව 2018 වර්ෂයේ දී රු. බිලියන 41.8 දක්වා සියයට 22.5කින් අඩු වී ඇත. මීට අමතරව, 2018 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරීම් රු. බිලියන 15.0 දක්වා වැඩි වීම ද බදු නොවන ආදායම් ඉහළ යාමට හේතු විය. 2018 වසර සඳහා ඇස්තමේන්තුගත බදු නොවන ආදායම රු. බිලියන 183.1 වූ අතර විකුණුම් සහ ගාස්තු වල ප්‍රසාරණය තථ්‍ය ආදායමේ අපගමනයට හේතු විය.

රූප සටහන 2.3.3.1 | බදු නොවන ආදායම




**2.3.3.1** වගුව | බදු නොවන ආදායම

රු.මිලි.

| **අයිතමය** | **2013** | **2014** | **2015** | **2016** | **2017** | **2018** (තාවකාලික) | **2017/2018 (% වෙනස)** | **2018 (සමස්ත බදු නොවන ආදායම %)** |
|---|---|---|---|---|---|---|---|---|
| පොලී/කුලී | 11,995 | 13,647 | 46,705 | 15,806 | 11,845 | 13,743 | 16.0 | 6.6 |
| ලාභ සහ ලාභාංශ | 35,169 | 46,814 | 66,255 | 77,917 | 53,998 | 41,828 | -22.5 | 20.1 |
| විකුණුම් සහ ගාස්තු | 40,721 | 35,499 | 131,552 | 144,844 | 66,575 | 105,204 | 58.0 | 50.7 |
| සමාජ ආරක්ෂණ දායක මුදල් | 15,145 | 14,919 | 11,995 | 13,647 | 22,940 | 25,214 | 9.9 | 12.1 |
| මහ බැංකු ලාභ පැවරීම | 26,350 | 11,500 | 35,169 | 46,814 | - | 15,000 | - | 7.2 |
| අනෙකුත් | 2,173 | 22,466 | 40,720 | 35,499 | 5,995 | 6,642 | 10.8 | 3.2 |
| **එකතුව** | **131,552** | **144,845** | **332,395** | **334,526** | **161,353** | **207,631** | **28.7** | **100.0** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### 3.0 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රමෝපායන් හා අභියෝග 2018

### 3.1 රජයේ මූල්‍ය ක්‍රමෝපායන්

රජයේ මූල්‍ය ක්‍රමෝපායන් මගින්, රජයේ ආදායම හා වියදම අතර තුලනය සහ රාජ්‍ය ණය පහත හෙලීමේ අරමුණ/ඉලක්කයන් අවධාරණය කෙරේ. 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත වගකීම් සහිත මූල්‍ය කළමනාකරණ මූලධර්ම පෙන්වා දෙන අතර, එම මූලධර්ම වලට අනුකූලව රජය මූල්‍ය ක්‍රමෝපායන් අනුගත කරගත යුතු ය. විචක්ෂණශීලී මට්ටමක් දක්වා රාජ්‍ය ණය පහත හෙලීම, විචක්ෂණශීලී මූල්‍ය අවධානම් කළමනාකරණ, රජයේ වියදම් හා බදුකරණයට අදාළ ව ප්‍රතිපත්ති අනුගත කර ගැනීම සහ රාජ්‍ය ඇපකර සහ රාජ්‍ය ණය නිර්දේශ සීමාවන් නො ඉක්ම වීම ආදිය එහි ඇතුලත් මූලධර්ම කිහිපයකි. වගකිව යුතු මූල්‍ය කළමනාකරණ මූලධර්ම සන්දර්භය තුල, මධ්‍යකාලීන ආදායම් රැස්කිරීම ඉහළ නැංවීම තුළින් තිරසාර අයවැය හිඟයක් හා රාජ්‍ය ණය අඩු කිරීම රජයේ ප්‍රමුඛ ඉලක්කයයි. ඒ අනුව, මාධ්‍යකාලීනව අයවැය හිඟය විශ්වාසනීය ස්ථායි අගයකට ගෙන ඒම සහතික කර ඇති අතර අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස 2018 වර්ෂයේ සියයට 4.9 සිට 2019 වර්ෂයේ සියයට 4.1 දක්වා ගෙන ඒමට හා මධ්‍යකාලීනව සියයට 3.5 දක්වා ගෙන ඒමට අපේක්ෂිතය. 2017 වර්ෂයේ ධන අගයක් ගත් අපේක්ෂිත ප්‍රාථමික අතිරික්තයේ වාසියෙන් මෙවන් අයවැය හිඟයේ අඩු කිරීම රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2018 වර්ෂයේ සියයට 76.6 සිට 2022 වර්ෂය වන විට සියයට 66 දක්වා පහත හෙළීමට මඟ පාදනු ඇත. ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2018 වර්ෂයේ සියයට 0.7 සිට 2019 වර්ෂයේ සියයට 1.8 දක්වා ඉහළ නැංවීමට ඇස්තමේන්තු කර ඇත.

බදුකරණය සහ එහි පරිපාලනය, වියදම් කළමනාකරණය, රාජ්‍ය ණය කළමනාකරණය, රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය මූල්‍ය සහ ප්‍රසම්පාදන කළමනාකරණය හා අනෙකුත් ක්ෂේත්‍ර තුළ මූල්‍ය ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ප්‍රතිසංස්කරණ කීපයක්ම 2018 වර්ෂය තුළ ක්‍රියාවට නංවන ලදී. නව දේශීය ආදායම් පනත හඳුන්වාදීම සහ ආදායම් රැස් කරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා සුරාබදු දෙපාර්තමේන්තුව ආදී ආයතන වල බදු පරිපාලන වැඩි දියුණු කිරීම, ඵලදායී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය උදෙසා ඉ-ප්‍රසම්පාදනය, රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය මෙහෙයුම් වඩා විනිවිදභාවයකට ගෙන ඒමට ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර සමඟ සංස්ථා අභිලාෂ ප්‍රකාශ අත්සන් කිරීම හා වෙළඳපළ මත තීරණය වන ඉන්ධන මිල තීරණ යාන්ත්‍රනයක් හඳුන්වාදීම යනාදිය ඇතු ළත් පුළුල් පදනමකින් යුතු ප්‍රතිසංස්කරණ 2018 වර්ෂයේ හඳුන්වා දෙන ලදී. මෙම වඩා පුළුල් මූල්‍ය රාමුවෙහි ඉදිරි දර්ශනය තුල, "ගම්පෙරලිය" වැඩසටහන හරහා වේගවත් ග්‍රාමීය හා නාගරික සංවර්ධනයක් සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර කීපයක් ප්‍රමුඛකරණය කිරීම, "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන හරහා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම, පෞද්ගලික අංශයට තල්ලුවක් ලබාදීමට යටිතල පහසුකම් අවශ්‍යතාවය සඳහා ආයෝජනය කිරීම, දරිද්‍රතාවය සවිබල ගැන්වීම සඳහා සහ අවදානමට ලක් වූ කණ්ඩායම් වෙත සුරක්ෂණයක් ඇති කිරීමට "සමෘද්ධි" වැනි සමාජ ආරක්ෂණ වැඩසටහන් සහ අනෙකුත් සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

### 3.2 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝග

ප්‍රධාන වශයෙන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වේගයකින් ආර්ථිකය වර්ධනය වීම සහ ආදායම් යෝජනා කිපයක් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම මෑත කාලීන ගෝලීය හා දේශීය ආර්ථික ප්‍රවණතා හමුවේ 2018 වර්ෂය තුළ රජයේ මූල්‍ය ස්ථායිකරණය අභියෝගයක් විය.

**ආදායම් වැඩි කිරීම**

රජය විසින් දැනටමත් ගෙන ඇති පියවර මගින් තවදුරටත් ආදායම් රැස්කිරීමේ උත්සාහය ශක්තිමත් කිරීම සිදු කරන ලදී. කෙසේ වුව ද සෘජු හා වක්‍ර බදු ඉහළ නැංවීමට අභියෝග කිහිපයක් එල්ල විය. සේවකයාගෙන් ආදායම් බදු රඳවා ගැනීමට සහ වෘත්තිකයන්ට ගෙවන සේවා ගාස්තු වලින් බදු රඳවා ගැනීමට සේවායෝජකයාට ඇති වගකීම විගණනය සහ එකතු කළ අගය මත බදු අනුකූලතා ක්‍රමෝපායන් අවධානම් පාදක විගණනයක් සමග ක්‍රියාවේ නැංවීම ආදී පියවර වල සහයෙන් බදු අනුකූලතාවය ශක්තිමත් කිරීමට ප්‍රධාන අවධානය යොමු කෙරේ.

**රාජ්‍ය වියදම් කළමනාකරණය**

අළුතෙන් පිහිටුවන ලද සුභ සාධන ප්‍රතිලාභ මණ්ඩලය හරහා වැඩි දියුණු කරන ලද ඉලක්ක කරණයකින් යුතුව සමාජ ආරක්ෂණ වැඩසටහන් ඉදිරියට කරගෙන යන අතර සමාජ සුභසාධන හා ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රමාණවත් අවකාශයක් සමස්ත වියදම් අවකාශය තුළ ලබාදීමට රජය සහතිකවේ. අවිනිශ්චිත අයවැයකරණය තුලින් ස්වාභාවික ආපදා හා සම්බන්ධ මූල්‍ය පිරිවැය අයවැයකරණය හා ස්වාභාවික ආපදා සඳහා රක්ෂණ යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම යන පියවර සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත. එලෙස පුනරාවර්තන වියදම් සාධාරනීකරණය සමඟ රජයේ වියදම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය දිරිගැන්වීම සහතික කරනු ඇත.

**රාජ්‍ය ව්‍යාපාරවල කාර්ය සාධනය වර්ධනය කිරීම**

රජය ඉදිරි කාලයේ දී රාජ්‍ය ව්‍යාපාර වල මූල්‍ය තත්වය හෙළිදරව් කිරීම වැඩි දියුණු කිරීමට සැලසුම් කෙරේ. විශේෂයෙන්ම, ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර සමඟ දැනටමත් අත්සන් කර ඇති සංස්ථාභිලාෂ ප්‍රකාශයන්ගේ සඳහන් කර ඇති ප්‍රධාන කාර්යසාධන දර්ශක අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කරනු ඇත.

**මධ්‍යකාලීන ණය කළමණාකරන ක්‍රමෝපාය ශක්තිමත් කිරීම**

ප්‍රතිමූල්‍යකරණ මෙහෙයුම් හා සම්බන්ධව ඕනෑම කම්පනයකට ඔරොත්තු දිය හැකි ලෙස මධ්‍යකාලීන මූල්‍ය රාමුව ශක්තිමත් කිරීම සඳහා පියවර කීපයක් ගනිමින් පවතී. ප්‍රතිමූල්‍යකරණ අවදානම අඩු කිරීම හා ණය වගකීම් කල්පිරීමේ කාලය දීර්ඝ කිරීම මඟින් ප්‍රතිමූල්‍යකරණ අවශ්‍යතාවයෙන් කොටසක් කල් ඇතිව ආමන්ත්‍රණය කිරීමට අවස්ථාවක් අලුතෙන් නීතිගත කළ සක්‍රිය වගකීම් කළමනාකරණ පනත මඟින් ලබාදේ. සක්‍රිය වගකීම් කළමනාකරණ මෙහෙයුම් සහය සඳහා විදේශ ණය වලට විවෘත වීම කළමනාකරණය කර ගත හැකි මට්ටම් වල සීමා කිරීමේ සමස්ත අරමුණෙන් යුතුව මැදිකාලීන ණය කළමනාකරණ ක්‍රමෝපාය ශක්තිමත් කිරීමට රජය කටයුතු කරයි.

## 4.0 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ අදාළ වාර්තා ප්‍රකාශයට පත් කිරීම

### 4.1 වාර්ෂික වාර්තාව -2017

මුදල් වර්ෂය අවසාන වී මාස 05ක් ඉක්ම යාමට මත්තෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මහජනතාවට නිකුත් කළ යුතු අවසාන අයවැය තත්වය පිළිබඳ වාර්තාව එනම් 2017 වාර්ෂික වාර්තාව, 2018 මැයි මස දී ප්‍රකාශයට පත් කෙරිණි.

### 4.2 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබද වාර්තාව -2018

මෙම වාර්තාව අදාළ වර්ෂයේ ජුනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස 06 ක් ඉක්ම යාමට පෙර යන කාලපරිච්ඡේද දෙකෙන් පළමුව එළඹෙන දිනට ප්‍රථම, සෑම වසරකම නිකුත් කළ යුතු අතර, ඒ අනුව, 2018 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2018 ජුනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

### 4.3 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව -2019

2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 04,05 සහ 06 වන වගන්ති යටතේ ඉදිරිපත් කෙරෙන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව 2019 සහ 07,08 සහ 09 වගන්ති යටතේ ඉදිරිපත් කළ යුතු අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව 2019 යන වාර්තා 02න් සමන්විත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2018 ඔක්තෝම්බර් මස ප්‍රකාශයට පත්කළ යුතු අතර 2019 වසරේ විසර්ජන පනත 2018 වසරේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලද බැවින් එම වාර්තාව නිකුත් නොකරන ලදී.

### 4.4 කාර්යසාධන වාර්තාව

### 4.5 තොරතුරු දැනගැනීමේ පනතට අදාළ වාර්තා

4.5.1 වගුව | 2018 තොරතුරු දැනගැනීමේ පනතට අදාල ඉල්ලීම් සාරාංශය

| | |
|---|---|
| ප්‍රතික්ෂේපිත ඉල්ලීම් | 10 |
| තොරතුරු ලබා දෙන ලද | 05 |
| අදාළ ආයතන වෙත යොමු කරන ලද | 03 |
| අභියාචනා | 05 |
| එකතුව | 23 |

## 5.0 ආයතන හා ගිණුම් අංශයේ කාර්යසාධනය

### 5.1 කාර්ය මණ්ඩල තොරතුරු

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව අනුමත කාර්ය මණ්ඩලය 56 කින් සමන්විත වේ. ඒ අනුව පහත සඳහන් සේවක මඩුල්ල දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබයි.

**5.1** වගුව | සේවක සංඛ්‍යා විස්තර 2018 (2018.12.31 දිනට)

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං. ප. සේ.) | **01** | **01** | **-** |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං. ප. සේ.) | **01** | **01** | **-** |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (විවෘත) | **01** | **-** | **01** |
| අධ්‍යක්ෂ (ශ්‍රී ලං. ප. සේ.) | **02** | **02** | **-** |
| අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍රි. සේ.) | **01** | **01** | **-** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං. ප. සේ.) | **09** | **05** | **04** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍රි. සේ.) | **05** | **05*** | **-** |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ග. සේ.) | **01** | **01** | **-** |
| පරිපාලන නිලධාරී | **01** | **01** | **-** |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/සිංහල) | **01** | **-** | **01** |
| භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ) | **01** | **01** | **-** |
| සංවර්ධන නිලධාරී | **08** | **08** | **-** |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | **10**** | **11** | **01** |
| රියදුරු | **07** | **06** | **01** |
| කා.කා.ස | **07***** | **08** | **-** |
| **එකතුව** | **56** | **51** | **08** |

*දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිළධාරින් 02 ඇතුළුව*

* *වැටුප් සහිත එතෙර අධ්‍යයන නිවාඩු -01*

** *නව සේවක සංඛ්‍යා සමාලෝචනය අනුව අනුමත කාර්ය මණ්ඩලය 03 කින් අඩු කර ඇත*

*** *නව සේවක සංඛ්‍යා සමාලෝචනය අනුව අනුමත කාර්ය මණ්ඩලය 01 කින් අඩු කර ඇත*

## 5.2 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

### 5.2.1 වගුව | දේශීය පුහුණු 2018

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | පුහුණුවට අදාල කාල සීමාව |
|---|---|---|---|
| ඩබ්.එස්.චින්තක මයා | සංවර්ධන නිලධාරී | File Management, General Office Administration and E Code | 2018 ජුනි 12/13/14 |
| ආර්.ඩී.එස්.ඩී.දේශප්‍රිය මිය | සංවර්ධන නිලධාරී | CEEP - MILODA | 2018 සැප්. 25 සිට |
| වසන්තා රමණී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | File Management, General Office Administration and E Code | 2018 ජුනි 12/13/14 |
| රමණී දිසානායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | File Management, General Office Administration and E Code | 2018 ජුනි 12/13/14 |
| පී.පී.යූ.කේ.විජේරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | Computerized Government Payroll System | 2018 ජූලි 24/25/26 |
| ඩබ්.එන්.ආර්.ලාලනී මිය | සංවර්ධන නිලධාරී | Budget Preparation, Monitoring and Treasury Accounting System | 2018 අගෝ. |
| එම්.පී.ආර්.එස්.ධනපාල මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | Budget Preparation, Monitoring and Treasury Accounting System | 2018 අගෝ. |
| රමණී දිසානායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | Public Finance Regulations | 2018 අගෝ. 15/16/17 |
| වසන්තා රමණී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | Public Finance Regulations | 2018 අගෝ. 15/16/17 |
| ඩබ්.ආර්.මධුවන්ති මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | DEJE | 2018 අගෝ. 20 සිට |
| ආචාර්ය පී. කේ. පී. හරිස්චන්ද්‍ර මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Invitation to Public-Private-Partnership workshop on the PPP Fiscal Risk Assesment Model | 2018 ඔක්. 02 හා 03 |
| ඒ. සාරාන්තන් මයා | අධ්‍යක්ෂ | | |
| එස්.එච්.එස්. සෙනෙවිරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | Diploma in English for Proffessionals | 2017 දෙසැ. 23 දින සිට |
| අරුණෝද නිශ්ශංක මයා | සහකාර අධ්‍යක්ෂ | Diploma in English for Proffessionals | 2018 දෙසැ.23 දින සිට |
| ලක්ෂිකා සේනාරත්න මිය | සහකාර අධ්‍යක්ෂ | Diploma in English for Proffessionals | 2018 දෙසැ. 23 දින සිට |
| ජේ. එම්. ආර්. පී. ජයසිංහ මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Bid evaluation in Public Procirement | 2018 සැප්.19-21 දක්වා |
| කුමුදු මීගහගේ මයා | අධ්‍යක්ෂ | Effective Communication Skills and Personality Development through Speechcraft | 2018 සැප්. |
| කේ.එම්.කුමාරසිරි මයා | සහකාර අධ්‍යක්ෂ | Annual Borrowing Plan | 2018 නොවැ.13 /16 |
| කේ.එම්.ඒකනායක මයා | සංවර්ධන නිලධාරී | | |

5.2.2. වගුව | විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ -2018

| නම | තනතුර | පුහුණු පාඨමාලාව | කාල සීමාව | කරුණ |
|---|---|---|---|---|
| කේ.ඒ.විමලේන්තිරාජා | අධ්‍යක්ෂ ජනරාල් | 8th Round of Sri Lanka – India ECTA Negotiations - **India** | 21.02.2018-23.02.2018 | දූත සේවා |
| | | Negotiations for the revision of the Agreement for Avoidance of Double Taxation between Sri Lanka and Netherland - **Netherland** | 16.07.2018-19.07.2018 | දූත සේවා |
| | | 10th Round of Sri Lanka – India ECTA Negotiations - India | 02.08.2018-04.08.2018 | දූත සේවා |
| | | MCC Compact Negotiations - **USA** | 01.10.2018 – 07.10.2018 | දූත සේවා |
| | | Annual Meetings of the World Bank Group and IMF -**Indonesia** | 08.10.2018 – 14.10.2018 | දූත සේවා |
| ආචාර්ය පී.කේ.ජී.හරිස්චන්ද මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Strengthened Fiscal Management in Asia - **Japan** | 04.06.2018 – 05.06.2018 | දූත සේවා |
| ආචාර්ය එම්.කේ.සී. සේනානායක මයා | අධ්‍යක්ෂ | International Conference on Innovation and Entrepreneurship (ICIE) - **USA** | 05.03.2018 - 06.03.2018 | දූත සේවා |
| | | Double Taxation Avoidance - **Latvia** | 13.10.2018 – 21.10.2018 | දූත සේවා |
| ඒ.සාරාන්කන් මයා | අධ්‍යක්ෂ | 2018 Ministerial Workshop on Financial Strategy for Developing Countries - **China** | 06.05.2018 – 12.05.2018 | පුහුණු |
| | | World Bank's Tax Policy Workshop - **India** | 06.08.2018 – 10.08.2018 | පුහුණු |
| ඩබ්.ටී.ඒ. පෙරේරා මිය | බදු උපදේශක | Agreement for the Avoidance of Double Taxation (DTAA) between Sri Lanka and Denmark - **Denmark** | 12.02.2018 – 16.02.2018 | දූත සේවා |
| | | Legal Design of Taxation Frameworks Relevant to the Asia - Pacific Region - **Singapore** | 27.05.2018 – 02.06.2018 | පුහුණු |
| | | International Visitor Leadership Program (IVLP) - **USA** | 04.08.2018 – 25.08.2018 | පුහුණු |
| ඩී.පී.එන්. කුමාරි මිය | සහකාර අධ්‍යක්ෂ | Managing Capital Flows-**India** | 10.09.2018 – 14.09.2018 | පුහුණු |
| පී.ඩී.එල්.පී.සේනාරත්න මිය | සහකාර අධ්‍යක්ෂ | World Bank's Tax Policy Workshop -**India** | 06.08.2018 – 10.08.2018 | පුහුණු |
| ඩී.එම්.එස්.ඒ.නිරෝෂන මයා | සහකාර අධ්‍යක්ෂ | 2018 Seminar on Training Business & Trade Law Professionals for B & R Countries | 01.09.2018 – 10.09.2018 | පුහුණු |
| කේ.එම්.කුමාරසිරි මයා | සහකාර අධ්‍යක්ෂ | Macroeconomic Management for effective governance and sustainable inclusive economic growth (Sri Lanka) - **Singapore** | 26.02.2018 – 02.03.2018 | පුහුණු |
| | | Financial Development and Financial Inclusion - **India** | 30.04.2018 – 04.05.2018 | පුහුණු |
| එල්. ඩී. යූ. එම්. සොයිසා මිය | සහකාර අධ්‍යක්ෂ | Two Years Master's Programme of Public Policy (MP2)-**Japan** | 2018 - 2020 | පුහුණු |

| | | | | |
|---|---|---|---|---|
| ආර්.එම්.කේ.එම්.ලක්මිණී මිය | සහකාර අධ්‍යක්ෂ | seminar on Promotion of Trade & Investment in Inland Regions for Developing Countries-**China** | 10.11.2018 – 30.11.2018 | පුහුණු |
| සී.කේ.විතාන මිය | සංවර්ධන නිලධාරී | 2018 Seminar on South – South Cooperation for Developing Countries-**China** | 10.072018 – 30.07.2018 | පුහුණු |
| ඊ.එම්.කේ.පී.කේ.එම්.ඒකනායක මයා | සංවර්ධන නිලධාරී | Fiscal Reporting - Improving the Coverage Comprehensiveness, Quality & Transparency-**India** | 10.09.2018 – 14.09.2018 | පුහුණු |
| ඩබ්.එන්.ආර්.සී.ලලනි | සංවර්ධන නිලධාරී | 2018 Seminar on Enterprise Transformation and Innovation Management for Foreign Officials under Belt & Road Initiative - **China** | 07.09.2018 - 29.09.2018 | පුහුණු |

### 5.3 මූල්‍ය පරිපාලනය

#### 5.3.1 අයවැය ප්‍රතිපාදන සහ උපයෝජනය

2018 වර්ෂය සඳහා 238 ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන යොදාගත් ආකාරය පහත දැක්වේ.

5.3.1.1 වගුව | අයවැය ප්‍රතිපාදන යොදා ගත් ආකාරය- 2018

| වියදම් විස්තරය | ඇස්තමේන්තු (රුපියල්) | ශුද්ධ ප්‍රතිපාදන (රුපියල්) | තථ්‍ය වියදම (රුපියල්) |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **4,080,460** | 4,080,460 | **60200,617** |
| පුද්ගල පඩිනඩි | 35,800,000 | 35,582,938 | 32,154,117 |
| ගමන් වියදම් | 4,100,000 | 9,938,227 | 9,938,227 |
| සැපයීම් | 2,920,000 | 3,270,788 | 3,260,339 |
| නඩත්තු වියදම් | 2,700,000 | 3,100,781 | 2,739,598 |
| ගිවිසුම්ගත සේවා | 4,034,240,000 | 4,027,867,266 | 11,524,987 |
| මාරු කිරීම් හා වෙනත් | 700,000 | 700,000 | 583,350 |
| **මූලධන වියදම්** | **1,600,000** | **1,600,000** | **718,079** |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | - | - | - |
| අත්පත් කර ගැනීම් | 1,000,000 | 1,000,000 | 356,793 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | - | - | - |
| හැකියා වර්ධනය | 600,000 | 600,000 | 361,287 |
| **මුළු වියදම** | **4,082,060,000.00** | **4,082,060,000** | **60,918,697** |

### 5.3.2 රජයේ නිලධාරීන්ගේ  අත්තිකාරම් ගිණුම

2018 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

5.3.2.1 වගුව | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 2018

| විස්තරය | අනුමත සීමාව (රුපියල්) | තථ්‍ය සීමාව (රුපියල්) |
|---|---|---|
| 1. උපරිම වියදම් සීමාව | 4,000,000 | 4,000,000 |
| 2. අවම ලැබීම් සීමාව | 1,700,000 | 1,700,000 |
| 3. උපරිම හර ශේෂ සීමාව | 15,000,000 | 15,000,000 |

### 5.3.3 විගණන විමසුම්

2016 වර්ෂය තුළ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06කට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 21කට පිළිතුරු ලබා දී ඇත.